# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

## වාර්ෂික වාර්තාව - 2015

# අන්තර්ගතය


- කොළඹ විශ්ව විද්‍යාලය i
- වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ii
- ඓතිහාසික පසුබිම iii
- අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය iv

1. සිසුන් සහ සම්පත් පිළිබඳ විස්තර 1
2. දේශීය සිසුන් පිළිබඳ විස්තර 1
3. අධ්‍යයනය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර 2
4. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර 2
5. පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර 2
6. වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර 4
7. දිනාගත් සම්මාන පිළිබඳ විස්තර 4
8. නව පාඨමාලා පිළිබඳ විස්තර 4
9. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර 5
10. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර 5
11. දේශීය / විදේශීය ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘති පිළිබඳ විස්තර 5
12. දේශීය / විදේශීය ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘතිවල වියදම පිළිබඳ විස්තර 6
13. මූල්‍ය ප්‍රගතිය (වියදම්) පිළිබඳ විස්තර 6
14. මූල්‍ය ප්‍රගතිය (උත්පාදනය කරන ලද ආදායම්) පිළිබඳ විස්තර 6
15. 2015 වර්ෂයේදී ලැබූ යටිතල පහසුකම් පිළිබඳ විස්තර 7
16. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය 2015 7
17. වෙනත් තොරතුරු 8
    - **17.1.** අධ්‍යාපනික ක්‍රියාකාරකම් 8
    - 17.2. ඇගයුම් සහ විභාග කටයුතු 18
    - 17.3. පුස්තකාලය 31
    - 17.4. සාමාන්‍ය පරිපාලනය 35
    - **17.5. මූල්‍ය 41**

18 විගණන වාර්තාව හා පිළිතුරු 51

# කොළඹ විශ්ව විද්‍යාලය


මහාචාර්ය ලක්ෂ්මන් දිසානා

උප කුලපති

කොළඹ විශ්ව විද්‍යාලය

කේ.ඒ.එස් එඩ්වර්ඩ් මයා
රෙජිස්ට්‍රාර්
කොළඹ විශ්ව විද්‍යාලය

**ඇමතුම්**
කොළඹ විශ්ව විද්‍යාලය,
කුමාරතුංග මුනිදාස මාවත
කොළඹ 00300, කොළඹ
;94* 112 581 835
;94* 112 584 695
;94* 112 585 509


**<u>දැක්ම</u>**

රටෙහි ප්‍රථම විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ඓතිහාසික සබැඳියාවන්ගෙන් ද උරුමයෙන් ලද බුද්ධිමය සම්ප්‍රදායයන්ගෙන් ද අභිප්‍රේරණය වූ කොළඹ විශ්ව විද්‍යාලය, රටෙහි බහුවාර්ගික සමාජයීය ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් ආරක්‍ෂා කරගනිමින් දැනුම, අධ්‍යාපනය, පර්යේෂණය, නිර්මාණශීලීත්වය සහ ව්‍යවසායකත්වයෙහි සහක්‍රියාකාරීත්වය තුළින් මානව සංවර්ධනය ප්‍රවර්ධනය කරන ලොව පිළිගත් ආයතනයක් වීමට ප්‍රයත්න දරයි.

**<u>මෙහෙවර</u>**

උසස් ආචාර ධර්ම සම්මතයන්ගෙන් සහ මනා සමාජයයී වගකීමකින් යුතුවූද , නව්‍ය අදහස් සහිත, නිවහල්, විශ්ලේෂණාත්මක චින්තනයෙන් යුතුවූ, ආර්ථික-සමාජයීය, සංස්කෘතික සහ පාරිසරික සංවර්ධනයෙහි හවුල්කාරයන් බවට පත්වීමේ ශක්‍යතාවයෙන් සමන්විත මානව ප්‍රාග්ධනය සමාජයට සැපයීම සඳහා අචල බැඳීමක් සහ කැපවීමක් සහිත සුවිශේෂී උසස් අධ්‍යාපන ආයතනයක් බවට පත්වීම.

මහාචාර්ය එච්.ජනක.ද.සිල්වා
**අධ්‍යක්ෂක**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

මහාචාර්ය සේනක රාජපක්ෂ
**නියෝජ්‍ය අධ්‍යක්ෂක**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

එස්.අනූෂා
**නියෝජ්‍ය ලේඛකාධිකාරී**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

**ඇමතුම්**
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
නො.160
මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවතල
කොළඹ 07
¿94* 112 697758
¿94* 112 681052
¿94* 112 696261

**ඇමතුම්**
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
නො.160
මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවතල
කොළඹ 07
¿94* 112 697758
¿94* 112 681052
¿94* 112 696261

**<u>දැක්ම</u>**

රටෙහි සහ කළාපයෙහි සෞඛ්‍ය අවශ්‍යතා ඉටු කිරීමත් ලෝක සෞඛ්‍ය ක්ෂෙත්‍රය කෙරෙහි දායකවීමත් උදෙසා ඉහළ කාර්යශූරත්වයෙන් යුතු විශේෂඥවරුන් සහ අනෙකුත් වෘත්තිකයන් බිහිකිරීමෙහි සුවිශේෂීතාව සඳහා ජාත්‍යන්තරව පිළිගත් මධ්‍යස්ථානයක් බවට පත්වීම.

විශ්ව විද්‍යාලයීය මට්ටම සාධනය කරගැනීමේ අවසන් අරමුණින් යුතුව අධ්‍යයනය, මූල්‍යමය සහ පරිපාලනමය වශයෙන් ස්වාධීනව ක්‍රියාත්මක වන ආයතනයක් බවට පත්වීම.

**<u>මෙහෙවර</u>**

ශ්‍රී ලාංකීය ජනතාවට, කළාපයට සහ ලෝකයට ප්‍රශස්ත සහ මානුෂික සෞඛ්‍ය සත්කාරය සැලසීම වෙනුවෙන් ඉහළම ගුණාත්මකභාවය, ප්‍රවීණත්වය සහ කැපවීම සහිත විශේෂඥවරුන් සහ අනෙකුත් වෘත්තිකයන් බිහිකිරීම සඳහා අවශ්‍ය පශ්චාත් අධ්‍යයන වැඩසටහන් සැලසුම් කිරීම සහ සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.

## අරමුණු සහ පරමාර්ථ

### අරමුණු

- ඉගැන්වීම්- ඉගෙනුම්, පුහුණු සහ පර්යේෂණයන්හි අඛණ්ඩ ඉහළ ස්ථාවරයන් සාක්ෂාත්කර ගැනීම.
- ජාතික සෞඛ්‍ය සේවා අවශ්‍යතාවන් සැපිරිය හැකි පරිදි පුහුණු වැඩසටහන් වැඩිදියුණු කිරීම.
- රටෙහි සෞඛ්‍ය සහ වෛද්‍ය අධ්‍යාපනික ප්‍රතිපත්තීන් විධිමත්ව සකස් කිරීම සඳහා දායක වීම.
- පශ්චාත් උපාධි වෛද්‍ය අධ්‍යාපනයෙහි සහ පර්යේෂණයන් සම්බන්ධයෙන් ආයතනයේ ක්‍රියාකාරීත්වය වඩා ව්‍යාප්ත සහ පුළුල් එකක් බවට පත්කිරීම.
- ආයතනයෙහි ඉහළ යන අධ්‍යාපනික අවශ්‍යතාවන් සැපිරිය හැකි පරිදි සහ එහි ගුණාත්මක භාවය තහවුරු වන පරිදි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

### පරමාර්ථ

- දේශීය අවශ්‍යතාව සැපිරිය හැකි පරිදි ඉහළ මට්ටමේ ගුණාත්මක භාවයකින් සමන්විත සෞඛ්‍ය සේවාවක් සඳහා ප්‍රමාණවත් මිනිස් සම්පතක් බිහි කිරීම.
- නිරන්තර ඉගෙනුම තුලින් සෞඛ්‍ය වෘත්තීකයින්ගේ කුසලතා සහ නිපුණතාවන් පවත්වාගෙන යාම සහ වැඩිදියුණු කිරීම.
- සෞඛ්‍ය වෘත්තීකයින් සඳහා නිරන්තර අධ්‍යයනයට සඳහා ඉඩ පහසුකම් සලසන ක්‍රමවේදයන් ඇතිකිරීම.
- වෛද්‍ය වෘත්තීකයින් තුළ සඵලදායක ආකල්ප සහ ස්වයං ඉගෙනුම් ප්‍රවර්ධනය කිරීම.
- පශ්චාත් උපාධි අධ්‍යයනයන්ට අදාළ සම්පත් සහ සුදුසු තාක්ෂණයන් භාවිතා කිරීම දිරිගැන්වීම.
- සෞඛ්‍ය ගැටළු විසඳීමේදී සෞඛ්‍ය සේවා කණ්ඩායම් භාවිතය පිළිබඳ සංකල්පය හඳුන්වාදීම.
- දුර්වලතා සහ වැඩිදියුණු කරගතයුතු අංශ පිළිබඳව තොරතුරු රැස්කරගැනීම සඳහා වෛද්‍ය අධ්‍යාපනික වැඩසටහන් ඇගයීමට ලක් කිරීම.
- නිවාරක සහ ප්‍රතිකාරක සත්කාරයන්ගෙන් සමන්විත සේවාස්ථ වැඩසටහන් සංවිධානය කිරීම.
- ශ්‍රී ලංකාව තුළ පශ්චාත් උපාධි මට්ටමේ වෛද්‍ය අධ්‍යාපනය ඉහළ මට්ටමකින් පවත්වාගැනීම සඳහා විදේශීය අධ්‍යාපනික ආයතන සමග අන්‍යෝන්‍ය ශුභසිද්ධිය සැලසෙන ආකාරයෙන් අධ්‍යාපනික සබඳතාවන් වැඩිදියුණු කරගැනීම.
- රටෙහි සෞඛ්‍ය සේවා අවශ්‍යතාවන් සැපිරීම මෙන්ම කලාපය සහ ලොව පුරා වෛද්‍ය විද්‍යාවේ විවිධ ක්ෂේත්‍රයනට ක්‍රියාකාරී දායකත්වයක් සපයන්නාවූ විශේෂඥ වෘත්තීකයන් බිහිකරන්නාවූද මූල්‍යමය සහ පරිපාලනමය වශයෙන් ස්වාධීනව ක්‍රියාත්මකවන ජාත්‍යන්තරව පිළිගැනීමක් සහිත විශිෂ්ට ආයතනයක් බවට පත්වීම.

# අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය



2015 වර්ෂය සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව අතිශයින්ම සතුටුවෙමි

ශ්‍රී ලංකාව තුළ වෛද්‍ය වෘත්තිකයන් සහ දන්ත වෛද්‍ය වෘත්තිකයන් පුහුණු කිරීම සඳහා පවතින එකම ආයතනය වන අප වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය තුළ වර්තමානය වනවිට අධ්‍යයන මණ්ඩල 22ක් සහ විශේෂ මණ්ඩල 38ක් තිබේ. රටෙහි අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්, අපගේ වැඩසටහන් සඳහා ඇතුළත් කරගනු ලබන වෛද්‍ය වෘත්තිකයන් සංඛ්‍යාව වැඩිකිරීමට, විශේෂයෙන්ම වෛද්‍ය උපාධි වැඩසටහන් සඳහා පුහුණුවන්නන් වැඩි පිරිසක් බඳවාගැනීමට අප මෙම වසරේදීද අඛණ්ඩව උත්සාහ කළෙමු.

අප ආයතනය මගින් 2015 වසරේදී පවත්වනු ලබන වැඩසටහන් 114 ක් වූ අතර පැවැත්වූ විභාග සංඛ්‍යාව 126 කි. එම්.ඩී. උපාධි 268 ක්ද එම්.එස්.සී. උපාධි 64ක්ද, පශ්චාත් උපාධි 87ක්ද, පිරිනමන ලදී. විශේෂඥ වෛද්‍යවරුන් ලෙස සුදුසුකම් ලබා ඇතිබවට ආයතනයේ අධ්‍යයන මණ්ඩල මගින් සහතික කරනු ලැබූ වෛද්‍යවරුන් ගණන 212 කි . මෙහි පුහුණුව ලබන වර්තමාන ශිෂ්‍ය සංඛ්‍යාව 2882 ක් වන අතර නව ඇතුළත් වීම් සංඛ්‍යාව 980 කි. ධූලක වෛද්‍ය විද්‍යාව පිළිබඳ එම්. එස්. සී උපාධි වැඩසටහන ඔන්ලයින් වැඩටහනක් වශයෙන් පැවැත්වීම සඳහා උසනසඔදං සමඟ එකඟතා ගිවිසුමක් අත්සන් කරනු ලැබූ අතර මෙමගින් විදේශ සිසුන් වැඩි සංඛ්‍යාවක් බඳවාගැනීමට හැකිවනු ඇත.

මෙම වසරේදීද අප ආයතනයේ පරිපාලන කටයුතු තවදුරටත් සරලව, කාර්යක්ෂමව සහ මනා සංවිධිත තත්ත්වයකින් පවත්වා ගැනීම සඳහා අපි පියවර ගත්තෙමු. පුහුණුවන්නන් සඳහා වන පොදු නියාමනයන් සහ මාර්ගෝපදේශ ප්‍රතිශෝධනය කර ඇති අතර පුහුණුවන්නන් මෙන්ම අධීක්ෂකවරුන් සහ විභාග පරීක්ෂකවරුන් සඳහාද නව නියාමනයන් සහ මාර්ගෝපදේශ සකස්කර තිබේ. පුහුණුවන්නන්ගේ ගැටළු සහ දුක්ගැනවිලි පිළිබඳව කටයුතු කිරීම සඳහා නිරීක්ෂණ මණ්ඩලයක් සකස්කිරීමේ වැඩපිළිවෙලක්ද නීතිපති දෙපාර්තමේන්තුවේ සහය ඇතිව සිදුකෙරෙමින් පවතී. කඩදාසි භාවිතය අවමකිරීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ නිර්දේශවලට අනුගත වෙමින් විශ්ව විද්‍යාල තුළ කඩදාසි සහ ප්ලාස්ටික් භාවිතය අවම කිරීමට පියවරගෙන තිබේ. විෂය මාලාවන් සහ නියාමනයන්ට සම්බන්ධ සියළුම ලේඛන මේ වනවිට ඇත්තේ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙනි.

යටිතල පහසුකම් වැඩිදියුණුකිරීමේ ව්‍යාපෘති 03ක්ද මේ වසර තුළ ක්‍රියාත්මකව පවතී. එනම් මහල් අටකින් යුතු වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයෙහි :එෑෂක* ඉදිකිරීම් කටයුතුල පැරණි ගොඩනැගිල්ල නැවත සකස්කිරීම සහ රොඩ්නි වීදියේ ව්‍යාපෘතිය වන අතර මෙම ව්‍යාපෘතීන් සියල්ලම නියමිත කාල සටහනකට අනුව ක්‍රියාත්මක වේ.

මෙම ප්‍රගමනය උදෙසා කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්, අධ්‍යයන මණ්ඩල, විශේෂඥ අධ්‍යයන මණ්ඩල සහ විභාග මණ්ඩල සාමාජිකයන්, පුහුණුකරුවන් සහ විභාග පරීක්ෂකයන්ගේ දායකත්වය පිළිබඳව මගේ ස්තූතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම තම රාජකාරි ප්‍රශංසනීය අන්දමින් ඉටුකර ඇති පරිපාලන සහ ලිපිකාර කාර්ය මණ්ඩලයටද විශේෂයෙන් ස්තූතිවන්ත වෙමි.

මහාචාර්ය එච්. ජානක ද සිල්වා
අධ්‍යක්ෂ/වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධිආයතනය

## කළමනාකරණ මණ්ඩලය

කළමනාකරණ මණ්ඩලය ප්‍රධාන විධායක කමිටුව මෙන්ම පරිපාලන අධිකාරියද වෙයි.

## නිල බලයෙන් පත්වන සාමාජිකයෝ

මහාචාර්ය ජානක ද සිල්වා. අධ්‍යක්ෂක, පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය

මහාචාර්ය සේනක රාජපක්ෂ. නියෝජ්‍ය අධ්‍යක්ෂක, පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය

මහාචාර්ය ජයන්ත ජයවර්ධන. වත්මන් අධ්‍යක්ෂකවරයාට ආසන්නතම හිටපු අධ්‍යක්ෂක, පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය

වෛද්‍යාචාර්ය සුනිල් ජයන්ත නවරත්න. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

සුධර්මා කරුණාරත්න මහත්මිය. ලේකම්, සෞඛ්‍ය

ආර්.එම්.පී රත්නායක මයා. ලේකම්, මුදල්

වෛද්‍යාචාර්ය පී.ජී. මහීපාල. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

මහාචාර්ය ජෙනිෆර් පෙරේරා. වැඩබලන පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

මහාචාර්ය එම්.ඩී. ළමාවංශ. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය

මහාචාර්ය එස්. ලේකම්වසම්. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, රුහුණු විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය එස්.බාලකුමාර්. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, යාපනය විශ්ව විද්‍යාලය

මහාචාර්ය මොහාන් ද සිල්වා. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

මහාචාර්ය එන්. ආර් ද සිල්වා. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය

මහාචාර්ය උපුල් බී. දිසානායක. පීඨාධිපති, දන්ත වෛද්‍ය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය කේ.ටී.සුන්දරේසන්. පීඨාධිපති, සෞඛ්‍ය උපස්ථායක විද්‍යා පීඨය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය

මහාචාර්ය එස්.එච්. සිරිබද්දන. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා හා ආශ්‍රිත විද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය ලක්ෂ්මී සෝමතුංග, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා) - 1

වෛද්‍යාචාර්ය ජේ.එම්.ඩබ්ලියු. ජයසුන්දර බණ්ඩාර, නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (දන්ත වෛද්‍ය සේවා)

වෛද්‍යාචාර්ය සුනිල් ද අල්විස්, නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ )

**අනෙකුත් සාමාජිකයින් ත**

මහාචාර්ය පී.ආර්. ප්‍රනාන්දු පීඨ නියෝජිත, වෛද්‍ය විද්‍යා පීඨය/, කොළඹ විශ්ව විද්‍යාලය

මහාචාර්ය පී.වී.ආර්.කුමාරමසිරි,පීඨ නියෝජිත, වෛද්‍ය විද්‍යා පීඨය/, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

මහාචාර්ය අයි.එම්.ආර්.ගුණවර්ධන. පීඨ නියෝජිත, වෛද්‍ය විද්‍යා පීඨය/, රුහුණු විශ්ව විද්‍යාලය

ආචාර්ය ටී.එස්.නවරත්නරාජා මිය. පීඨ නියෝජිත, වෛද්‍ය විද්‍යා පීඨය/, යාපනය විශ්ව විද්‍යාලය

මහාචාර්ය දුලානි ගුණසේකර. පීඨ නියෝජිත, වෛද්‍ය විද්‍යා පීඨය/, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය එස්.එස්.විලියම්ස්. පීඨ නියෝජිත, වෛද්‍ය විද්‍යා පීඨය/, කැලණිය විශ්ව විද්‍යාලය

මහාචාර්ය එස්.එල්.ඒකනායක. පීඨ නියෝජිත, දන්ත වෛද්‍ය විද්‍යා පීඨය/,පේරාදෙණිය විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය ඒ.එන්.අරුල්ප්‍රගාසම්. පීඨ නියෝජිත,සෞඛ්‍ය උපස්ථායක විද්‍යා පීඨය/,නැගෙනහිර විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය එස්.පී.බී.තල්ගස්පිටිය. පීඨ නියෝජිත, වෛද්‍ය විද්‍යා සහ ආශ්‍රිත  විද්‍යා පීඨය/, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය

මහාචාර්ය එස්.ඩී.ජයරත්න**(සභාපති)** ඊ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත්කල සාමාජික

මහාචාර්ය මල්කාන්ති චන්ද්‍රසේකර ඊ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත්කල සාමාජික

මහාචාර්ය අබ්දුල් හුසේන් ඊ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත්කල සාමාජික

මහාචාර්ය නන්දදේව සමරසේකර ඊ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත්කල සාමාජික

මහාචාර්ය  රංජනී ගමගේ (මිය) ඊ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත්කල සාමාජික

ආචාර්ය  හර්ෂ කබ්රාල්ඊ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත්කල සාමාජික

ආචාර්ය එස්.රවිරාජ්ඊ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත්කල සාමාජික

රාජන් ආශිර්වාදන් මයා/ සභාව විසින් නම් කරන ලද සාමාජික

සී.මාලියද්දේ මයා/ සභාව විසින් නම් කරන ලද සාමාජික

## ඓතිහාසික පසුබිම

1870 වර්ෂයේ දී ලංකා වෛද්‍ය විද්‍යාලය ස්ථාපනය කිරීමත් සමඟ ශ්‍රී ලංකාව තුළ වෛද්‍ය අධ්‍යාපනය ආරම්භ වූ අතර 1942 දී ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් අනතුරුව එහි වෛද්‍ය පීඨය බවට පත්වන්නේ මෙම ලංකා වෛද්‍ය විද්‍යාලයයි . එම්.ඩී සහ එම්.ඕ.ජී උපාධි පිරිනැමීම සඳහා විභාග පැවැත්වීම ආරම්භවූ 1952 වර්ෂයද එම්.එස් උපාධිය පරිනැමීම සඳහා විභාග පැවැත්වීම ආරම්භවූ 1953 වර්ෂයද වනතුරුම ලංකා විශ්වවිද්‍යාලය මගින් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ප්‍රදානය සඳහා විභාග පවත්වනු නොලැබිණ.

එවකට ලංකාව තුළ ව්‍යුහාත්මක හෝ සංවිධිතාත්මක පශ්චාත් උපාධි පුහුණුකිරීම් සිදු නොකෙරුණු අතර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි පුහුණුව ලබාගත හැකිවූයේ එක්සත් රාජධානියේ පැවැති වෛද්‍ය විද්‍යාතන මගිනි. එවායින් පිරිනමනු ලැබූ එෂෘකුෂ, ෆුෂෘඛ, ත්ෆුෂෘඛ, එෂෘකධය, ෆුෂෘකුෂෘ,එෂෘකුජ්එය,එෂෘකුෂිහජය සහ තීසෘඛ වැනි සුදුසුකම් විශේෂඥ වෛද්‍යවරුන් පත්කිරීමේදී සෞඛ්‍ය අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල මගින් පිළිගන්නා ලද සුදුසුකම් විය. මෙම විදේශ පුහුණුව වෙනුවට අධීක්ෂණය කරනු ලැබීමට යටත්ව තෙවසරක සේවාස්ථ පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව විභාගයක් පැවත්වියයුතු බව 1973 වසරේ දී, වෛද්‍ය විද්‍යාපශ්චාත් උපාධි අධ්‍යාපනය පිළිබඳ උපදේශක කමිටුවක් මගින් රජයට නිර්දේශ ඉදිරිපත්කරනු ලැබීය. ඒ අනුව, 1972 අංක 1 දරන ලංකා විශ්ව විද්‍යාල පනතේ විධිවිධාන යටතේ 1976 වසරේ දී පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය (ෂඡඨඑ) ස්ථාපනය කර කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ කරනු ලැබීය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්, වෛද්‍ය හැල්ෆ්ඩෑන් මාහ්ලර් විසින් 1976 මාර්තු 2 වන දින පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය (ෂඡඨඑ) නිල වශයෙන් ආරම්භකරනු ලැබූ අතර මහාචාර්ය කේ.එන්. සෙනෙවිරත්න මහතා එහි ප්‍රථම අධ්‍යක්ෂවරයා වශයෙන් පත්විය.

කෙසේ වුවද, එක්සත් රාජධානියේ විද්‍යායතන මගින් පවත්වනු ලැබූ විභාග කොළඹ දී පැවැත්වීම අඛණ්ඩව සිදුවීමත්, වෛද්‍ය වෘත්තිකයන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විභාගවලට පෙනීසිටීමට වඩා එක්සත් රාජධානියේ විභාගවලට පෙනී සිටීමට ප්‍රියමනාපභාවයක් දැක්වීම හේතුකොටගෙන අභිනවයෙන් පිහිටුවනු ලැබූ ආයතනයේ කටයුතු අඩාල විය. එබැවින්, මෙම ආයතනයේ

ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම අවශ්‍ය විය. එක්සත් රාජධානියේ විද්‍යායතන මගින් ශ්‍රී ලංකාව තුළ විදේශීය පශ්චාත් උපාධි විභාග පැවැත්වීම 1980 ජනවාරි 1 වනදා සිට ක්‍රියාත්මකවන පරිදි නවතාලීමටත්, මෙමආයතනයමගින් ලබාදෙන පශ්චාත් උපාධි සඳහා පූර්ණ පිළිගැනීමක් ලබා දීමට සහ වැඩි සැලකිල්ලක් දැක්වීමටත් රජය තීරණය කරන ලදී.

ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ අරමුණින් මෙම ආයතනය 1978 අංක 16 දරනවිශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ 1979 වසරේ දී නැවත ස්ථාපනයකර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය(ෂඨෂඑ) ලෙස නැවත නම්කරනු ලැබීය. වෛද්‍ය එස්.ජේ. කබ්රාල් මහතා එහි ප්‍රථම අධ්‍යක්ෂවරයා ලෙස පත්කරනු ලැබීය.

ඒ අනුව, ඉහත සඳහන් කරන ලද විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ සම්පාදනය කරන ලද 1980 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන

(ෂඨෂඑ*ආඥාපනත අංක 1 1980 අප්‍රේල් මස 10 වනදා සිට බලාත්මක විය. වෛද්‍ය විද්‍යාවේ විවිධ විශේෂඥතාවන් සඳහා අධ්‍යයන මණ්ඩල ප්‍රතිසංවිධානය කරනු ලැබූ අතර නිර්වින්දනවේදය, ප්‍රජා වෛද්‍යවිද්‍යාව, දන්ත ශල්‍යවේදය, පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය කර්මය, වෛද්‍යවිද්‍යාව, නාරිවේදය හා ප්‍රසවවේදය, අක්ෂිවේදය, ව්‍යාධිවේදය, ළමාචිකිත්සාව, මනෝචිකිත්සාව, විකිරණවේදය සහ ශල්‍යවේදය වැනි විවිධ විශේෂඥතාවන් සඳහා පාඨමාලා හා විභාග සංවිධානය කරන ලදී. 1985 වසරේ දී තවත් අධ්‍යයන මණ්ඩල

හතරක් එනම්, ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව, වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව, කර්ණ නාසික ස්වරාලවේදය සහ සායනික අර්බුදවේදය ස්ථාපනයකරනු ලැබීය. මහාචාර්ය ආර්.ජී. පානබොක්කේ මහතා 1990 වසරේ දී මෙම ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස පත්විය. වෛද්‍ය පරිපාලනය සහ චර්මවේදය පිළිබඳ අධ්‍යයන මණ්ඩල 1994 දී ද, මෛථුනවේදය පිළිබඳ අධ්‍යයන මණ්ඩල 2001 වසරේ ද ස්ථාපනය කරන ලදී. වෛද්‍යජේ.බී.පීරිස් මහතා 1995 වසරේ ද, මහාචාර්ය ලලිතා මෙන්ඩිස් මහත්මිය 2002 වසරේ ද, මහාචාර්ය රෙස්විෂෙරීෆ් මහතා 2006 වසරේ ද, මහාචාර්ය ජයන්ත ජයවර්ධන 2012 වසරේ ද, මහාචාර්ය එච්.ජානක ද සිල්වාමහතා 2014 වසරේ ද මෙම ආයතනයේ අධ්‍යක්ෂවරුන් ලෙස පත්වූහ.නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර 2011 වසරේ දී ස්ථාපනය කරන ලද අතර මහාචාර්ය ජයන්ත ජයවර්ධන, මහාචාර්ය ප්‍රශාන්ත විජේසිංහ, මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන සහ මහාචාර්ය සේනක රාජපක්ෂ මෙම ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර දැරූහ. 1980 ආඥාපනත සඳහා සිදුකරන ලද සංශෝධන 2014 ජූලි 1 වන දින සිට බලාත්මකවූ අතර සංශෝධිත ආඥාපනත යටතේ නව අධ්‍යයන මණ්ඩල කීපයක් සහ විවිධ විශේෂඥතාවන් සඳහා අධ්‍යයන මණ්ඩල කීපයක් ස්ථාපනය කරන ලදී.

## 1ග සම්පත් හා සිසුන් පිළිබඳ විස්තර

| පාඨමාලාව | පුහුණු ලාභීන් සංඛ්‍යාව | සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|
| සේවාස්ථ පුහුණු | 118 | ෆ |
| පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලා | 87 | ෆ |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 533 | ෆ |
| එම්එස්සී | 152 | ෆ |
| එම්ඩී (පූර්ව එම්ඩී/ පශ්චාත් එම්ඩී) | 1938 | ෆ |
| **එකතුව** | **2828** | |

*ක්ෂේත්‍ර විශේෂඥයින්ගේ සේවය බාහිර කථිකාචාර්යවරුන් ලෙෂ ලබාගනු ලැබේ

## 2දේශීය සිසුන් පිළිබඳ විස්තර

| පාඨමාලාව | 2015 කාණ්ඩය | පළමු වසර | දෙවන වසර | තෙවන වසර | උපාධිධාරීන් | සිවුවැනි වසර | පස්වන වසර | හයවැනි වසර |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | පශ්චාත් උපාධි පුහුණු | | |
| සේවාස්ථ | 70 | 97 | | 21 | | | | |
| පශ්චාත් උපාධි සහතිකපත්‍ර | 60 | 87 | | | 87 | | | |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 324 | 437 | 96 | | 281 | | | |
| එම්එස්සී | 126 | 126 | 26 | | 66 | | | |
| එම්ඩී | 400 | 426 | 357 | 313 | 273 | 319 | 107 | 20 |
| එතෙර පුහුණු | | | | | | 230 | 136 | 30 |
| **එකතුව** | **980** | **1173** | **479** | **334** | **707** | **549** | **243** | **50** |

## 3. අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර

| පීඨය/ශාඛාව | විෂයය/විනය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | කථිකාචාර්ය | උපදේශක |
|---|---|---|---|---|---|---|---|
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | අධ්‍යක්ෂ | 01 | | | | | |
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | | 01 | | | | |
| වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය | රසායනාගාර සේවා | | | 02:කොන්ත්‍රාත්* | | | |
| වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය | සායනික සේවා | | | 01 | | | |
| වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය | වෛද්‍ය අධ්‍යාපනය | | | 01 | 01 | | |
| අධ්‍යයන | අර්ධ කාලීන පාඨමාලා අධ්‍යක්ෂක | 03 | | | | | |
| පුස්තකාල | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති | 02 | | | | | |
| | සහකාර පුස්තකාලාධිපති | 03 | | | | | |

## 4.අනධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර

| පීඨය/ශාඛාව | පරිපාලන | අධ්‍යයන සහාය | ලිපිකරු සහ සමාන්තර | සුළු සේවක |
|---|---|---|---|---|
| ආයතන සහ සාමාන්‍ය පරිපාලන | 01 | 03 | 13 | 11 |
| අධ්‍යයන සහ වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය | 03 | - | 15 | 03 |
| | | - | 03 | 02 |
| විභාග | 03 | 01 | 22 | 03 |
| ගිණුම් | 02 | - | 12 | 02 |
| පුස්තකාලය | - | - | 10 | 06 |

## 5. පර්යේෂණ නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

| විෂයය | භාරදීම් |
|---|---|
| පර්යේෂණ සංඛ්‍යාව | - |
| උපාධි ප්‍රබන්ධ සංඛ්‍යාව | 99 |
| නිබන්ධන සංඛ්‍යාව | - |
| ලිපි සංඛ්‍යාව | **99** |

## 6.වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර

| විෂයය | සහභාගී වූ සංඛ්‍යාව | සම්පූර්ණ කළ සංඛ්‍යාව |
|---|---|---|
| පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව | | 46 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව | | 19 |
| උපාධි වැඩසටහන් සංඛ්‍යාව | හසෘ | හසෘ |
| ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව | හසෘ | හසෘ |
| සහතිකපත්‍ර වැඩසටහන් සංඛ්‍යාව | හසෘ | හසෘ |
| වෙනත් | | |
| පශ්චාත් උපාධි සහතිකපත්‍ර වැඩසටහන් | | 03 |
| සම්මන්ත්‍රණ, වැඩමුළු සහ අධ්‍යයන වැඩසටහන් | 45 | |
| ප්‍රශ්ණ පත්‍ර | | |
| **එකතුව** | **45** | **68** |

## 7. ලැබුණු සම්මාන පිළිබඳ විස්තර

සම්මාන ලැබී නැත

## 8. නව පාඨමාලාවන් පිළිබඳ විස්තර

**නව පාඨමාලාවන් ඇරඹීමක් සිදු නොවිනි. 2016 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පහත පුහුණු වැඩසටහන් සඳහා පූර්ව නිවේදනයන් සැකසීමට පියවර ගනු ලැබිනි.**

- ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- වෘද්ධ වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- සෞඛ්‍යයට අදාළ තොරතුරු පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- පෝෂණය පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- රක්ත-අර්බුදවේදය පිළිබඳව වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- වේදනා සමන උපස්ථානය පිළිබඳව පශ්චාත් උපාධිය

9. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

| විෂයය | 2014 රුපියල් | 2015 රුපියල් |
|---|---:|---:|
| විෂයය | 83,850,623 | 112,943,383 |
| පුද්ගල පඩිනඩි | 8,632,373 | 9,267,976 |
| ගමන් වියදම් | 7,403,596 | 7,243,017 |
| සැපයුම් | 2,923,260 | 5,901,999 |
| නඩත්තු වියදම් | 21,014,609 | 23,692,216 |
| ගිවිසුම්ගත සේවාවන් | 56,372,401 | 66,995,900 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 15,700,120 | 15,109,133 |
| පශ්චාත් උපාධි පුහුණු වියදම් | **195,896,982** | **241,153,624** |

10. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

| විෂයය | 2014 රුපියල් | 2015 රුපියල් |
|---|---:|---:|
| ගෘහභාණ්ඩ සහ උපකරණ අත්කර ගැනීම | 4,863,857 | 2,569,047 |
| විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ අත්කර ගැනීම | 204,000 | 2,548,271 |
| ගොඩනැගිලි අත්කරගැනීම සහ ඉඩම් අත්කරගැනීම (රොඩ්නි මාවත) | 249,160,500 | |
| ග්‍රන්ථ සහ වාර සඟරා අත්කර ගැනීම | 13,687,150 | 9,122,923 |
| ගෘහභාණ්ඩ සහ උපකරණ අත්කර ගැනීම | | 10,819,390 |
| වෙනත් ඃඋපාධි ලෝගු) | | 27,000 |
| වෙනත් ඃවිදුලි බෙදාහැරීම) | | 3,540,430 |
| වත්කම් පුනරුත්තාපනය සහ නඩත්තුකිරීම සහ | 981,344 | |
| වෙනත් | **268,896,851** | **28,627,061** |

11. වයාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක)

| ව්‍යාපෘතියේ නම සහ විස්තර | ණය/ ප්‍රදානය | අරමුදල් සම්පාදක | සමස්ත පිරිවැය ඇස්තමේන්තුව | අයදුම්පත සඳහා ඉල්ලීම | වට්ටම් සංගුණකය |
|---|---|---|---|---|---|
| **ජෛව වෛද්‍ය විඥාපන විද්‍යාව පිළිබඳ එම්.එස්.සී උපාධිය සඳහා විද්‍යාපති අධ්‍යයනය පිළිබඳ නොරාඩ් වැඩසටහන ඃහධඒ*** | ප්‍රදානය | ඔස්ලෝ විශ්ව විද්‍යාලය | 138ල356ල221 | ෆ අදාළ නොවේ | ෆ අදාළ නොවේ |
| **දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය ඃෑඑෂ*** | ප්‍රදානය | | 7ල568ල536 | ෆ අදාළ නොවේ | ෆ අදාළ නොවේ |
| **එකතුව** | | | **145ල924ල757** | | |

* අදාළ නොවේ ̈ වාර්ෂික ප්‍රධානය කල් ඇතිව ලබා දී ඇත

12. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක)

| ව්‍යාපෘතියේ නම | සමස්ත පිරිවැය ඇස්තමේන්තුව | 2014වසරේ වියදම රුපියල් | 2015 වසරේ වියදම රුපියල් | 31ශ12ශ2015 දිනට සමුච්චිත වියදම රුපියල් |
|---|---|---|---|---|
| ජෛව වෛද්‍ය විඥාපන විද්‍යාව පිළිබඳ එම්.එස්.සී උපාධිය සඳහා විද්‍යාපති අධ්‍යයනය පිළිබඳ නොරාඩ් වැඩසටහන ඃහධඒ* | 138ල356ල221 | 18ල888ල945 | 1ල061ල002 | 134ල831ල182 |
| දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය ඃැඑඡ* | 7ල568ල536 | 12ල215 | 25ල500 | 7ල183ල596 |
| **එකතුව** | **145ල924ල757** | **18ල901ල160** | **1ල086ල502** | **142ල014ල778** |

13.මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම)

| විෂයය | රජයේ ප්‍රධානයන් 2015 | උත්පාදිත ආදායම 2015 | වියදම 2014 | ඉතුරුම් අතිරික්තය |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් ව්‍යාපෘතිය | 64ල000ල000 | 217ල162ල867 | 241ල153ල624 | 40ල009ල243 |
| ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘතිය | | | | |
| දේශීය අරමුදල් මත ක්‍රියාත්මක ව්‍යාපෘති | 350ල000ල000 | - | 415ල424ල779 | ඃ65ල424ල779* |
| | - | - | - | - |
| විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක ව්‍යාපෘති | | | | |
| | - | - | - | - |
| **එකතුව** | **414ල000ල000** | **217ල162ල867** | **656ල578ල403** | **ඃ25ල415ල536*** |

14. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම)

| ආදායම් මූලාශ්‍රය | 2014 ප්‍රතිපාදන රුපියල් | 2014 එකතු වූ මුදල රුපියල් | හිඟය/අතිරික්තය රුපියල් |
|---|---|---|---|
| ප්‍රථම උපාධි අධ්‍යයනය | - | - | - |
| පශ්චාත් උපාධි අධ්‍යයනය | 163ල000ල000 | 202ල337ල597 | 39ල337ල597 |
| විශේෂඥ උපදේශකත්වයන් | - | - | - |
| වෙනත් | 3ල300ල000 | 14ල378ල190 | 11ල078ල190 |
| **එකතුව** | **166ල300ල000** | **216ල715ල787** | **50ල415ල787** |

## 15.2015 වසරේදී ලැබූ යටිතල පහසුකම් පිළිබඳ විස්තර

| යටිතල පහසුකම් විස්තර | වියදම රුපියල් | කාර්ය ප්‍රගතිය |
|---|---|---|
| ගොඩනැගිල්ලේ දකුණු කොටසෙහි ඇති වැසිකිළි අළුත්වැඩියා කිරීම | 9ල796ල743ග98 | සම්පූර්ණ කර ඇත |
| ප්‍රධාන ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම | 12ල917ල225ග00 | සම්පූර්ණ කර ඇත |
| හතර වැනි මහලේ ඇති අධ්‍යයන කලාප අළුත්වැඩියා කිරීම | 1ල075ල571ග20 | සම්පූර්ණ කර ඇත |
| ආබාධ සහිතවූවන්ගේ භාවිතය සඳහා වැසිකිළියක් ඉදිකිරීම. | 658ල494ග50 | සම්පූර්ණ කර ඇත |
| තව් සහිත කෝණ ආවරණය | 473616ග80 | සම්පූර්ණ කර ඇත |

## 16. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2015

| විෂයය | සූත්‍රය | සිසුවකු සඳහා වූ වියදම |
|---|---|---|
| එක් සිසුවකු/සිසුවියක සඳහා වූ පුනරාවර්තන වියදම | පුනරාවර්තන වියදම - සිසුන්/සිසුවියන් සංඛ්‍යාව | 85ල273ග55 |
| එක් සිසුවකු/සිසුවියක සඳහා වූ ප්‍රාග්ධන වියදම | පුනරාවර්තන වියදම - සිසුන්/සිසුවියන් සංඛ්‍යාව | 10ල122ග72 |
| **එකතුව** | | **95ල396ග27** |

## 17. වෙනත් තොරතුරු

### 17.1 ආයතනික ක්‍රියාකාරකම්

#### 17.1.1. ලියාපදිංචි කිරීම්

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2015 වසර තුළ අධ්‍යයන මණ්ඩල 22 ක සහ විශේෂඥ මණ්ඩල 18 ක සෘජු අධීක්ෂණය යටතේ එම්.ඩී, එම්.එස්.සී, පී.ජී ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර යන ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි පාඨමාලාවන් 114 ක් පවත්වනු ලැබිනි. **(වගුව 01)**

එම්.ඩී, එම්.එස්.සී, පී.ජී ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර යන ක්ෂේත්‍රයන්හි උපාධි පාඨමාලාවන් සඳහා වූ පුහුණු වැඩසටහන් සඳහා නවක සිසුන් 980 ක් ඇතුලත් සමස්තයක් ලෙස 2828 ක් වූ පශ්චාත් උපාධි පුහුණුලාභීන් සංඛ්‍යාවක් බඳවා ගනු ලැබිනි.**(වගුව 02)** ඔවුන් අතරින් **2432 දෙනෙකු** දේශීය වශයෙන් පුහුණුව ලබති.

#### 17.1.2. අධ්‍යයන අවධාරණය

2015 වසරේ අධ්‍යයන අවධාරණය කේන්ද්‍රගත වූයේ නව පුහුණු වැඩසටහන් හඳුන්වාදීම , ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විෂය මාලාවන් සමග ප්‍රමිතිගත වෙමින් සහ නව ශිල්පක්‍රම අන්තර්ග්‍රහණය කරගනිමින් පවතින පුහුණු වැඩ සටහන් ප්‍රතිශෝධනය කරගැනීම මගින් ඒවායේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම කෙරෙහිය.

මෙම වසරේදීද එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව සහ මැලේසියාවේ විශිෂ්ට කේන්ද්‍රස්ථානයන්හි සිදුකරන එම්.ඩී. උපාධි පරීක්ෂණවල බාහිර විභාග පරීක්ෂකයන්ගේ වාර්තාවන්හි සඳහන් නිර්දේශ පදනම් කරගෙන පුහුණුකරුවන් සහ විභාග පිළිතුරුපත්‍ර පරීක්ෂකයන් නව ශිල්පක්‍රම වලින් සන්නද්ධ කිරීමට මෙන්ම විභාග ආකෘතිපත්‍ර වල තත්ත්වය ඉහළ නැංවීම සහ පුහුණු වැඩසටහන්වල සහ විභාගවල පිළිගතහැකි ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ඔවුනට උචිත මාතෘකා ඔස්සේ වැඩමුළු මාලාවක් පවත්වන ලදී

මෙම වර්ෂය තුළදී පවත්නා වැඩසටහන්වල පහත සඳහන් විෂය ධාරාවන් සහ විස්තර ප්‍රකාශපත්‍ර ප්‍රතිශෝධනය සිදු කරනු ලැබිනි

- ක්ෂය රෝගය සහ ළය රෝග පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- ළමා සෞඛ්‍යය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- සාමාන්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ එම්.ඩී.උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
- ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී. උපාධිය
- ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී. උපාධිය
- ළමාචිකිත්සා දැඩි සත්කාර ප්‍රතිකාර පිළිබඳ මණ්ඩල සහතිකකරණය
- ළමා වෘක්කවේද චිකිත්සාව පිළිබඳ මණ්ඩල සහතිකකරණය
- ළමා චිකිත්සා හෘත්වේදය පිළිබඳ මණ්ඩල සහතිකකරණය
- ප්‍රජා ළමා චිකිත්සනය පිළිබඳ මණ්ඩල සහතිකකරණය
- ළමා චිකිත්සා ස්නායුවේදය පිළිබඳ මණ්ඩල සහතිකකරණ
- කර්ණනාසිකස්වරාලවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- අක්ෂිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- විකිරණවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- පුනර්ජීවන දන්තචිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- මනෝචිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- මෛථුනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය

- සායනික රක්තවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- දන්ත - හනු චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- ස්නායුවේදය පිළිබඳව වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- ළමාචිකිත්සා
- ළමාචිකිත්සා අන්තරාසර්ගවේදය පිළිබඳව වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- නවජ සහ පරිසූතික ඖෂධ පිළිබඳව වෛද්‍ය මණ්ඩලයේ අනුමැතිය
- ප්‍රජා වෛද්‍යවිද්‍යාව/ප්‍රජා දන්තචිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය
- නීති වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- රක්තවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

**17ග1ග3ග පශ්චාත් උපාධි පුහුණුලාභීන් සඳහා සාමාන්‍ය රෙගුලාසි සහ මාර්ගෝපදේශ**

2013 වසරේදී ප්‍රකාශයට පත් කරන ලද පශ්චාත් උපාධි පුහුණුලාභීන් සඳහා සාමාන්‍ය රෙගුලාසි සහ මාර්ගෝපදේශ පිළිබඳව වූ ලේඛණය 2016 වසරේ ජනවාරි මස සිට ක්‍රියාත්මක කළ හැකිවන පරිදි 2015 වසර තුළදී කළමනාකරණ මණ්ඩලය/සෙනේට් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ අන්තර්ගත කරගනිමින් සංශෝධනය කරනු ලැබිනි.

**වගු අංක 01- වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යයන වැඩසටහන්**

| අධ්‍යයන මණ්ඩල | **සහතිකපත්‍ර/ඩිප්ලෝමාවන්** |
|---|---|
| | **විද්‍යාපති/උපාධි/ උප විශේෂඥයන්** |
| නිර්වින්දනවේදය | නිර්වින්දනවේදය පිළිබඳව නිපුණතා සහතිකය |
| | උග්‍රාවස්ථා උපස්ථාන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | **උප විශේෂඥයන්** |
| | පහත ක්ෂේත්‍රයන්හි විශේෂ පුහුණුව සහිත නිර්වින්දනවේදය |
| | හෘත් - උරස්ථ නිර්වින්දනවේදය |
| | ස්නායුවේද නිර්වින්දනවේදය |
| | ප්‍රසවවේද නිර්වින්දනවේදය |
| | ළමා චිකිත්සක නිර්වින්දනවේදය |
| | දැඩි සත්කාර නිර්වින්දනවේදය |
| | වේදනා කළමනාකරණ නිර්වින්දනවේදය |
| මූලික වෛද්‍ය විද්‍යාවන් | කායව්‍යවච්ඡේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | භෞතවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| ප්‍රජා වෛද්‍ය විද්‍යාව සහ ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව | ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය |
| | ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය |
| | ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| සායනික අර්බුදවේදය | සායනික අර්බුදවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | රක්තවේද අර්බුදවේදය |
| දන්ත ශල්‍යවේදය | රෝහල් දන්ත පිළිවෙත පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | රෝහල් දන්ත පිළිවෙත පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (දුරස්ථ අධ්‍යාපන) |
| | මුඛ හා හනුවක්ත්‍ර ශල්‍ය චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | විකලාංග දන්ත චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | පුනර්ජීවන දන්ත චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | මුඛ ව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| චර්මවේදය | චර්මවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| පවුල් වෛද්‍ය විද්‍යාව | පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (දුරස්ථ අධ්‍යාපනය) |
| | පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය(උපාධි නිබන්ධනය මගින්) |
| | පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය(විභාගය මගින්) |
| ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව | නීති වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| වෛද්‍ය විද්‍යාව | ක්ෂය රෝගය සහ ළය රෝග පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | **උප විශේෂඥයන්** |
| | හෘත්වේදය |
| | හෘත්විද්‍යුත භෞතවේදය |
| | අන්තෝසර්ගවේදය |
| | ආමාශයික අන්ත්‍රවේදය |
| | වෘක්කවේදය |
| | ස්නායුවේදය |

| | |
|---|---|
| | ස්නායු භෞතවේදය |
| | ස්වසන වෛද්‍ය විද්‍යාව |
| | වාතරක්තවේදය සහ පුනරුත්ථාපනය |
| වෛද්‍ය පරිපාලනය | වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්.එස්.සී උපාධිය |
| | වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්.ඩී උපාධිය |
| වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව | වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | සායනික වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | පරපෝෂවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | වෛරසවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | දිලීරවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| බහුවිෂයක්ෂේත්‍රීය අධ්‍යයන පාඨමාලා | වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකපත්‍රය |
| | අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | වයෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | සෞඛ්‍ය ආංශික ආපදා කළමණාකරණය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | ජෛව වෛද්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය |
| | වෛද්‍ය ධූලකවේදය පිළිබඳව එම්.එස්.සී උපාධිය |
| | අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය |
| | හදිසි අවස්ථා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | **උප විශේෂ්‍යය** |
| | සායනික ඖෂධ විද්‍යාව සහ චිකිත්සාව |
| නාරිවේදය හා ප්‍රසවවේදය | ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | නාරිවේදය හා ප්‍රසවවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | **උප විශේෂ්‍යයන්** |
| | නාරිවේද අර්බුදවේදය |
| | ඌණ - දරුඵල චිකිත්සාව |
| අක්ෂිවේදය | අක්ෂිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | **උප විශේෂ්‍යයන්** |
| | දෘෂ්ටිපටල ශල්‍යවේදය |
| | ළමාචිකිත්සා අක්ෂිවේදය |
| | ඇසේ සුද මතුවීම සහ බාහිර අක්ෂි රෝග |
| | ඇසේ කක්ෂිය සහ ඇස වටා කෙරෙන ප්ලාස්ටික් සැත්කම් |
| කර්ණනාසිකස්වරාලවේදය | කර්ණනාසිකස්වරාලවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| ළමාචිකිත්සාව | ළමා සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | ළමාචිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | **උප විශේෂ්‍යයන්** |
| | ළමාචිකිත්සා නවප්‍රසූතිවේදය |
| | ළමාචිකිත්සා හෘත්වේදය |
| | ළමාචිකිත්සා වෘක්කවේදය |
| | ළමාචිකිත්සා ස්නායුවේදය |
| | ළමාචිකිත්සා දැඩිසත්කාර |
| | ළමාචිකිත්සා අන්තරාසර්ගවේදය |
| | ළමාචිකිත්සා ස්වසනවේදය |
| | ප්‍රජා ළමා චිකිත්සාව |
| ව්‍යාධිවේදය | මූලික පරීක්ෂණාගාර විද්‍යා පිළිබඳව සහතික පත්‍රය |
| | පටක ව්‍යාධිවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | රසායනික ව්‍යාධිවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |

| | |
|---|---|
| | පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | රක්තවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | පටක ව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | රසායනික ව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | රක්තවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| මනෝචිකිත්සාව | මනෝචිකිත්සාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | මනෝචිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය |
| | **උප විශේෂඥයන්** |
| | ව්‍යවහාරික මනෝචිකිත්සාව |
| | ළමා හා නවයෞවන මනෝචිකිත්සාව |
| විකිරණවේදය | විකිරණවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | **උප විශේෂඥයන්** |
| | මැදිහත්වීම් විකිරණවේදය |
| | ළමාචිකිත්සක විකිරණවේදය |
| ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව | ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| ශල්‍යවේදය | ශල්‍යවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | විකලාංගවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |
| | පහත ක්ෂේත්‍රයන් අවධාරණය කෙරෙන සාමාන්‍ය ශල්‍යවේදය |
| | පශ්චර ආන්ත්‍රික ශල්‍යවේදය |
| | යාකෘත්ප්‍රදාහ අග්න්‍යාශයික පිත්ත ශල්‍යවේදය |
| | පහළ පශ්චර ආන්ත්‍රික ශල්‍යවේදය |
| | වාහිණී ශල්‍යවේදය |
| | පියයුරු ශල්‍යවේදය |
| | අන්තෝසර්ග ශල්‍යවේදය |
| | ක්ෂති ශල්‍යවේදය |
| | **උප විශේෂඥයන්** |
| | ශල්‍ය අර්බුදවේදය |
| | හෘත් - උරස්ථ ශල්‍යවේදය |
| | ආමාශයික අන්ත්‍ර ශල්‍යවේදය |
| | ළමා චිකිත්සක ශල්‍යවේදය |
| | ප්ලාස්ටික් ශල්‍යවේදය |
| | මෞත්‍රලිංගික ශල්‍යවේදය |
| | මෞත්‍රවේදික ශල්‍යවේදය |
| | වාහිණී ශල්‍යවේදය |
| | බද්ධකිරීමේ ශල්‍යවේදය |
| | ස්නායු ශල්‍යවේදය |
| | උරස්ථ ශල්‍යවේදය |
| මෛථුනවේදය | මෛථුනවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | මෛථුනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය |

වගුව 02 - නවක ඇතුළත්වීම් 2015

| වැඩසටහන | නවක ඇතුළත්වීම 2015 | ඩිප්ලෝමා/ සහතික පත්‍ර | පශ්චාත් උපාධිය | එම්.එස්.සී උපාධිය | එම්.ඩී උපාධි පූර්ව | පශ්චාත් උපාධි (දේශීය) | විදේශීය | | සමස්තය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | දෙවන වසර | තෙවන වසර | |
| | | | 1 | 2 | 3 | 4 | 5 | | 12345 |
| මූලික පරීක්ෂණාගාර විද්‍යා පිළිබඳව සහතිකපත්‍රය | 30 | 57 | | | | | | | 57 |
| වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව සහතිකපත්‍රය | 30 | 30 | | | | | | | 30 |
| රසායනික ව්‍යාධිවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 4 | | 11 | | | | | | 11 |
| රක්තවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 13 | | 34 | | | | | | 34 |
| පටක ව්‍යාධිවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 10 | | 30 | | | | | | 30 |
| කායව්‍යවච්ඡේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | | | | | | | | | 0 |
| ළමා සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 80 | | 80 | | | | | | 80 |
| උග්‍රාවස්ථා උපස්ථාන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 19 | | 40 | | | | | | 40 |
| වයෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 14 | | 30 | | | | | | 30 |
| පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 50 | | 50 | | | | | | 50 |
| සෞඛ්‍ය අංශ ආපදා කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 30 | | 44 | | | | | | 44 |
| රෝහල් දන්ත පිළිවෙත පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 18 | | 18 | | | | | | 18 |
| නීති වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 9 | | 18 | | | | | | 18 |
| වෛද්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය | | | | | | | | | 0 |
| වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 13 | | 28 | | | | | | 28 |
| අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | | | | | | | | | 0 |
| භෞතවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | | | 8 | | | | | | 8 |
| මනෝචිකිත්සාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | | | | | | | | | 0 |
| ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 13 | | 29 | | | | | | 29 |
| ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 0 | | | | | | | | 0 |
| පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 8 | | 17 | | | | | | 17 |
| ක්ෂය රෝගය සහ ළය රෝග පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 36 | | 74 | | | | | | 74 |
| මෛථුනවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 7 | | 22 | | | | | | 22 |
| ජෛව වෛද්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව | 22 | | | 28 | | | | | 28 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| එම්.එස්.සී උපාධිය | | | | | | | | | |
| ප්‍රජා දන්ත චිකිත්සාව පිළිබඳව එම්.එස්.සී උපාධිය | 9 | | | 9 | | | | | 9 |
| ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය | 36 | | | 36 | | | | | 36 |
| මානව පෝෂණය පිළිබඳව එම්.එස්.සී උපාධිය | 26 | | | 26 | | | | | 26 |
| වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්.එස්.සී උපාධිය | 5 | | | 5 | | | | | 5 |
| වෛද්‍ය ධූලකවේදය පිළිබඳව එම්.එස්.සී උපාධිය | 28 | | | 48 | | | | | 48 |
| සේවාස්ථ සායනික අර්බුදවේදය | | | | | | | | | 0 |
| සේවාස්ථ අක්ෂිවේදය | 9 | 11 | | | | | | | 11 |
| සේවාස්ථ විකිරණවේදය | 0 | 21 | | | | | | | 21 |
| රසායනික ව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 10 | 32 | | | | | | | 32 |
| රක්තවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 2 | | | | 4 | | 4 | | 8 |
| පටකව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 12 | | | | 39 | 3 | 9 | | 51 |
| නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 3 | | | | 13 | 4 | 9 | | 26 |
| සායනික අර්බුදවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 35 | | | | 91 | 22 | 29 | 3 | 145 |
| ප්‍රජා දන්තචිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය | 6 | | | | 10 | 5 | 8 | | 23 |
| ප්‍රජා වෛද්‍යවිද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය | 3 | 3 | | | | | | | 3 |
| චර්මවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 5 | | | | 11 | | 2 | | 13 |
| හදිසි අවස්ථා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය | 26 | 26 | | | | | | | 26 |
| පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය | 30 | | | | 65 | | 17 | | 82 |
| වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය | 8 | | | | 21 | 11 | 8 | | 40 |
| වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්.ඩී උපාධිය | 22 | | | | 53 | | | | 53 |
| අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය | | | | | 10 | 13 | 1 | | 24 |
| වෛද්‍ය පරපෝෂවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 7 | | | | 18 | 4 | 1 | | 23 |
| වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය | 3 | | | | 3 | | | | 3 |
| නාරිවේදය සහ ප්‍රසවවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 20 | | | | 46 | 5 | 1 | | 52 |
| මුඛ හා හනුවක්ත්‍ර ශල්‍ය චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය | 14 | 14 | | | | | | | 14 |
| අක්ෂිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 6 | | | | 22 | 21 | 11 | | 54 |
| මුඛ ව්‍යාධිවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | | | | | 1 | | | | 1 |
| මුඛ ශල්‍යවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 76 | | | | 199 | 131 | 102 | 7 | 439 |
| දන්ත හනු චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය | 12 | | | | 52 | 15 | 11 | 1 | 79 |
| විකලාංග ශල්‍යවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 5 | | | | 19 | 3 | 3 | | 25 |
| කර්ණනාසික ස්වරාලවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 8 | 11 | | | | | | | 11 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ළමාචිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය | 14 | | | | 23 | 15 | 4 | | 42 |
| මනෝචිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය | 1 | | | | 1 | 1 | | | 2 |
| විකිරණවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 6 | | | | 14 | | 2 | | 16 |
| පුනර්ජීවන දන්ත චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය | | | | | 18 | 15 | | | 33 |
| ශල්‍යවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 2 | | | | 10 | 1 | 9 | 1 | 21 |
| පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය | 29 | | | | 83 | 40 | 21 | 8 | 152 |
| මෙථුනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 10 | | | | 40 | 36 | 17 | 2 | 95 |
| වෛරසවේදය පිළිබඳව එම්.ඩී උපාධිය | 18 | | | | 36 | 21 | 25 | 2 | 84 |
| වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්.එස්.සී උපාධිය | 8 | | | | 16 | | 2 | | 18 |
| වෛද්‍ය ධූලකවේදය පිළිබඳව එම්.එස්.සී උපාධිය | 41 | | | | 113 | 96 | 56 | 6 | 271 |
| සේවාස්ථ සායනික අර්බුදවේදය | 6 | | | | 13 | 4 | 3 | | 20 |
| සේවාස්ථ අක්ෂිවේදය | 11 | | | | 20 | 9 | 8 | | 37 |
| සේවාස්ථ විකිරණවේදය | 2 | | | | 4 | | 2 | | 6 |
| එකතුව | **980** | **205** | **533** | **152** | **1068** | **474** | **366** | **30** | **2828** |

## 17.1. (අ) වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය (MERC)

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් මෙහෙයවන ලද වැඩසටහන් රැසක මූලිකත්වය දැරීමේ අවස්ථාව 2015 වසරේදී ද වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයට හිමිවිය.

## 17.1. (අ) 1. අධ්‍යයන ක්‍රියකාරකම්

වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය අභිනවයෙන් දියත් කරන ලද සහ එමගින් සම්බන්ධීකරණය කරනු ලබන පාඨමාලාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම මගින් මෙම වර්ෂය වඩාත් හරවත් කරනු ලැබූ අතර බහුවිෂය ක්ෂේත්‍ර අධ්‍යයන පාඨමාලා පිළිබඳව අධ්‍යයන මණ්ඩලයේ සහ වෛද්‍ය විද්‍යා පිළිබඳ අධ්‍යයන මණ්ඩලයේ සියළු විශේෂඥතා මණ්ඩල ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධීකරණයද වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් සිදුකරන ලදී.

**වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් සම්බන්ධීකරණය කරනු ලබන පාඨමාලාවන්**

වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලය විසින් පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවන් දෙකක් පවත්වනු ලැබේ .

1. **භෞතවෛද්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව** - මෙය වර්ෂ 1 1/2 ක අර්ධකාලීන පාඨමාලාවකි. මෙහි පළමු කණ්ඩායම 2015 ඔක්තෝබර් මාසයේ සිය පුහුණුව සම්පූර්ණ කරනලදී.
2. **කාය විච්ඡේදනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව** - මෙය වර්ෂ 1 1/2 ක අර්ධකාලීන පාඨමාලාවකි. මෙහි පළමු කණ්ඩායම 2015 ජනවාරි මාසයේ පුහුණුව සම්පූර්ණ කරනලද අතර දෙවන කණ්ඩායම සඳහා බඳවා ගැනීමේ විභාගය 2015 ඔක්තෝබර මාසයේදී පවත්වන ලදී.

**විවිධ අධ්‍යයන ක්‍ෂෙත්‍රයන් පිළිබඳ අධ්‍යයන මණ්ඩලය**

1. **වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව, වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම්.ඩී. උපාධිය**

2. වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව යනු වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව දක්වා ගමන් කළ හැකි සය මාසික අර්ධකාලීන පාඨමාලාවකි. සයවැනි කණ්ඩායමේ පුහුණුවූවන්ගෙන් දහහතර දෙනෙකු 2015 වසරේදී වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව සම්පූර්ණ කරනලදී. තිදෙනෙකු වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම්.ඩී. උපාධි පුහුණුවට සම්බන්ධ විය.

3. **සෞඛ්‍ය ක්‍ෂෙත්‍රයේ අපදාවන් කළමණාකරණය කරගැනීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව**

   මෙය පූර්ණ කාලීන එක් අවුරුදු පාඨමාලාවකි. දෙවැනි කණ්ඩායමේ පුහුණුවූවන්ගෙන් එකොළොස් දෙනෙකු 2015 පෙබරවාරි මාසයේදී වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව සම්පූර්ණ කරනලදී. තෙවෙනි කණ්ඩායම සඳහා සම්බන්ධ වූ සංඛ්‍යාව විසි අටකි.

4. **හදිසි වෛද්‍ය ප්‍රතිකාර පිළිබඳ එම්.ඩී. උපාධිය**

   මෙය රෝහල කේන්ද්‍රගතකරගත් පූර්ණ කාලීන තුන් අවුරුදු පාඨමාලාවකි. දෙවැනි කණ්ඩායමෙහි පුහුණුවන්නන් දහහතර දෙනෙකු 2014 නොවැම්බර් මාසයේදී මෙම පාඨමාලාවට සම්බන්ධ වූ අතර 2015 නොවැම්බරයේදී මෙම පාඨමාලාවෙහි තෙවැනි කණ්ඩායම වශයෙන් විසිදෙදෙනෙකු ඊට සම්බන්ධ විය.

5. **අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳ එම්. එස්. සී. උපාධිය**

   මෙය දෑ අවුරුදු සය මාසික පූර්ණකාලීන පුහුණු පාඨමාලාවකි. පුහුණුවන්නන් පස් දෙනෙකු 2015 මැයි මාසයේ සිට මෙම පාඨමාලාව ආරම්භ කරනලදී.

6. **ධූලක වෛද්‍ය විද්‍යාව පිළිබඳ එම්. එස්. සී. උපාධිය**

මෙය අන්තර්ජාල භාවිතයෙන් එදදාකැ ඉගෙනුම් කළමණාකරණ ක්‍රමවේදය තුළින් සිදුකෙරෙන දුරස්ථ අධ්‍යයන වැඩසටහනකි.

7. **බයෝමෙඩිකල් ඉන්ෆොමැටික්ස් එම්. එස්. සී. උපාධිය**

මෙහි පස්වැනි කණ්ඩායමට තේරීපත්වූ පුහුණුවන්නන් සයදෙනෙකු 2014 ජූනි මස මෙම පාඨමාලව ඇරඹූ අතර සයවැනි කණ්ඩායමට තේරීපත්වූ පුහුණුවන්නන් විසි දෙදෙනෙකු 2015 සැප්තැම්බර් මස පුහුණුව ඇරඹීය.

8. **සායනික ඖෂධවේදය සහ චිකිත්සකවේදය පිළිබඳ එම්.ඩී. උපාධිය**

මෙම පාඨමාලාව ආරම්භ කරන ලද්දේ සායනික ඖෂධවේද උපදේශකයෙකු ලෙස ස්වාධීනව සහ ඵලදායක ලෙස කටයුතු කළහැකි ප්‍රමාණවත් දැනුමක්, හැකියාවන්, සහ ආකල්ප සහ දක්ෂතාවන් ඇති වෛද්‍යවරයෙකු බිහිකිරීමේ මූලික අරමුණ ඇතිවය.

**17.1. (අ). 2. වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය මගින් පුහුණුලාභීන් උදෙසා පවත්වනු ලැබූ වැඩමුළු**

1. පශ්චාත් උපාධි පුහුණුවන්නන් සඳහා වෛද්‍ය පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ කෙටි පාඨමාලාව (2015 වසරේදී දෙවතාවක් පැවැත්වින)

2. ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය සඳහා වූ සනාථන මණ්ඩලය සඳහා ලිපිගොනු පවත්වාගෙන යෑම සම්බන්ධ වැඩමුළුව.

3. වෛද්‍ය වෘත්තියේ යෙදීමේදී එහි ආචාරවිධි සහ වෘත්තීකභාවය සම්බන්ධයෙන් පශ්චාත් එම්.ඩී. උපාධි අපේක්ෂකයන් සඳහා වැඩමුළුව.

**17.1. (අ).3 පුහුණුකරුවන් සහ විභාග පරීක්ෂකවරුන් සඳහා** වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය ඃඑැඍක* **විසින් පවත්වනු ලැබූ වැඩමුළු**

i. BOS විකිරණවේදයට සම්බන්ධ පුහුණුකරුවන් සහ විභාග පරීක්ෂකවරුන් සඳහා ක්ෂේත්‍රයයක් පවත්වාගෙන යාම සහ අධීක්ෂණය

ii. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි විභාග පරීක්ෂාකරුවන් පුහුණුකිරීමේ වැසටහන

**17.1. (අ).4 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන සඟරාව (JPGIM)**

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන සඟරාවෙහි පරිපාලනමය සහ සංස්කරණ කටයුතු සම්බන්ධීකරණය වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය මගින් සිදුකරනු ලැබේ. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන සඟරාවෙහි දෙවන වෙළුම 2015 වසරෙහිදී ශ්‍රී ලංකා මාර්ගගත සඟරා ඔස්සේ මාර්ගගතව ප්‍රකාශයට පත්කරන ලදී.

**17.1.(අ).5 වෛද්‍ය වෘත්තික ආචාරධර්ම සමාලෝචන කමිටුව (ERC/PGIM)**

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන වෛද්‍ය වෘත්තික ආචාරධර්ම සමාලෝචන කමිටුව සිය කටයුතු ඇරඹූයේ 2012 වසරේදීය.2014 වසර වනවිට ප්‍රජා වෛද්‍ය විද්‍යාව/දන්ත වෛද්‍ය විද්‍යාව/වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්.එස්.සී උපාධි පුහුණුලාභීන් සහ වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී. උපාධි පුහුණුලාභීන්ගේ අයදුම්පත්‍ර 49 ක ප්‍රමාණයක් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන වෛද්‍ය වෘත්තික

ආචාරධර්ම සමාලෝචන කමිටුව විසින් පරීක්ෂාකර බලනු ලැබිනි. කමිටුවෙහි ලේඛන පරිපාලන කටයුතු උදෙසා සහායය වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් සැපයේ.

**17.1. අ. 6. අධ්‍යයන කටයුතු, ප්‍රතීතනය, විභාග සහ විනය පිළිබඳව වූ ස්ථාවර කමිටුව (AAAEDC)**

2015 වසරේදී අධ්‍යයන කටයුතු, ප්‍රතීතනය, විභාග සහ විනය පිළිබඳව වූ ස්ථාවර කමිටුවෙහි කටයුතු උදෙසා පරිපාලනමය සහාය සම්බන්ධීකරණය වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් සිදුකරනු ලැබිනි.

## 17.2. ඇගයුම් සහ විභාග කටයුතු

### 17.2.1 විභාග

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් 2015 වසර තුළදී එම්.ඩී උපාධි විභාග 40 ක්, එම්. එස්.සී. උපාධි විභාග 06ක්, පශ්චාත් උපාධි ඩිප්ලෝමා විභාග 19 ක්, පශ්චාත් උපාධි සහතික පත්‍ර විභාග 03ක් සහ තෝරාගැනීමේ විභාග 41 ක් පවත්වනු ලැබිනි. මෙම 2014 වසරේ පැවැත්වුනු විභාගයන් සඳහා අපේක්ෂකයන් 4041 ක් සහභාගී වූ අතර ඒ අතුරින් අපේක්ෂකයන් 1833 දෙනෙක් සාර්ථක ප්‍රථිඵල අත්කරගෙන තිබිනි. (වගුව 03)

### 17.2.2. උපාධි ප්‍රධානෝත්සවය

කොළඹ විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලැබූ වාර්ෂික පශ්චාත් උපාධි ප්‍රධානෝත්සවයේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා, එම්.එස්.සී උපාධි සහ එම්.ඩී. උපාධි 586 ක් ප්‍රධානය කරන ලදී.

### 17.2.3. විදේශ පුහුණු

පශ්චාත් උපාධි පුහුණුලාභීන් 396 දෙනෙකු තම අනිවාර්යය විදේශ පුහුණු පිළිගත් පුහුණු මධ්‍යස්ථාන වෙතින් ලබාගැනීම සිදුවිය. (වගු අංක 04)

### 17.2.4. මණ්ඩල සහතිකකරණය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ පිළියෙළ කිරීමේ 'වක්‍ර ක්‍රමය' භාවිත කරමින් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ පිළියෙළ කර තිබේ. මුදල් සහ බැංකු ශේෂයන් මෙන්ම කෙටි කාලීන ආයෝජනවලින් බැංකු අයිරා අඩු කිරීම මගින් මුදල් සහ මුදල් හා සමාන දේ දක්වනු ලැබේ.

**17.5.9. සේවක ප්‍රතිලාභ**

- **නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම**

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ අදාළ වන අනුපාතිකයන්ගෙන් විශ්‍රාම පාරිතෝෂික සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසනු ලබයි. මෙම පනත යටතේ පාරිතෝෂික ගෙවීම

සඳහා සුදුසුකම් ලැබීම සඳහා සේවකයන් විසින් අවම වශයෙන් වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ යුතු වුවද, සියලුම සේවකයන් අවම වශයෙන් වසර පහක්වත් අඛණ්ඩව සේවය කරනු ඇතැයි උපකල්පනය පදනම් කර ගනිමින් සේවකයා සේවය කිරීම ආරම්භ කරන දින සිට මේ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

**නිශ්චිත දායකත්ව සැලසුම් - විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල**

සේවකයන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ සාමාජිකයෝ වෙති. නිශ්චිත දායකත්ව සැලසුම්, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, සේවක අර්ථසාධක අරමුදල

## 17.5.10. සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති - 1 ට අනුකුල වන පරිදි සඳහන් කර ඇත.

**POSTGRADUATE INSTITUTE OF MEDICINE**
**UNIVERSITY OF COLOMBO**
**STATEMENT OF FINANCIAL POSITION**
**AS AT 31ST DECEMBER 2015**
(Figures adjusted to the nearest rupee)

| | Notes | 2015 Rs. | | 2014 Rs. | |
|---|---|---|---|---|---|
| **ASSETS** | | | | | |
| **Current assets** | | | | | |
| Inventories/Stock | 1 | 1,874,642 | | 1,518,453 | |
| Trade and Other receivables | 2 | 42,870,626 | | 44,268,789 | |
| Prepayments | 3 | 1,328,361 | | 1,122,813 | |
| Cash and cash equivalents | 4 | 18,926,005 | 64,999,635 | 47,789,945 | 94,700,000 |
| **Non current assets** | | | | | |
| Property plant and equipment | 5 | 376,137,575 | | 373,673,224 | |
| Work In Progress - MERC Building | | 434,716,825 | | 51,816,437 | |
| Investment | 6 | 142,600,904 | 953,455,304 | 110,393,689 | 535,883,350 |
| **TOTAL ASSETS** | | | 1,018,454,939 | | 630,583,350 |
| **LIABILITIES** | | | | | |
| **Current Liabilities** | | | | | |
| Payables | 7 | 34,651,312 | | 33,461,107 | |
| Accrued Expenses | 8 | 32,488,714 | 67,140,026 | 17,845,279 | 51,306,385 |
| **Non - Current Liabilities** | | | | | |
| Provision for Gratuity | | 22,000,643 | 22,000,643 | 22,202,558 | 22,202,558 |
| **Total Liabilities** | | | 89,140,668 | | 73,508,943 |
| **NET ASSET** | | | 929,314,271 | | 557,074,407 |
| **Net Assets / Equity** | | | | | |
| Capital | 9 | | 985,804,894 | | 555,260,549 |
| Accumulated Fund | 10 | | (66,924,493) | | (6,829,328) |
| Restricted Fund | 11 | | 10,433,870 | | 8,643,186 |
| **Total Assets / Equity** | | | 929,314,271 | | 557,074,407 |

Prepared by :
Acting for Deputy Bursar

Members of the Board Management of PGIM are responsible for preparation and presentation of these financial statements. These Financial statements were approved by the Board of Management and signed on their behalf.

Accounting Officer (Director)

Member of the Board of Management of PGIM

**17.5.11. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

(අගයන් ආසන්නතම රුපියලට වටයා ඇත.)

| වත්කම් | වියදම | 2015 රුපියල | | 2014 රුපියල් | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| ජංගම වත්කම් | | | | | |
| බඩු ලේඛන/තොග | 1 | 1,876,642 | | 1,518,453 | |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් | 2 | 42,870,626 | | 44,268,789 | |
| පූර්ව ගෙවීම් | 3 | 1,328,361 | | 1,122,813 | |
| මුදල් සහ පර්යාය මුදල් | 4 | 18,926,005 | 64,999,634 | 47,789,945 | 94,700,000 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 5 | 376,137,576 | | 373,673,224 | |
| ඉදි කරමින් පවතින දෑ | | 434,716,825 | | 51,816,438 | |
| ආයෝජන | 6 | 142,600,904 | 953,455,305 | 110,393,688 | 535,883,350 |
| **මුළු වත්කම්** | | | 1,018,454,939 | | 630,583,350 |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| ගෙවිය යුතු මුදල් | 7 | 34,684,312 | | 33,461,106 | |
| උපචිත වියදම් | 8 | 32,488,714 | 67,140,026 | 17,845,279 | 51,306,385 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 22,000,642 | 22,000,642 | 22,202,558 | 22,202,558 |
| **මුළු වගකීම්** | | | | | |
| **ශුද්ධ වත්කම්** | | | 89,140,668 | | 73,508,943 |
| ගෙවිය යුතු මුදල් | | | **929,314,271** | | **557,074,407** |
| **ශුද්ධ වත්කම්/සම කොටස්** | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනය | 9 | | 985,804,894 | | 555,260,549 |
| සමුච්චිත අරමුදල | 10 | | (66,924,493) | | (6,829,328) |
| සීමිත අරමුදල | 11 | | 10,433,870 | | 8,643,186 |
| **මුළු වත්කම්/සම කොටස්** | | | **929ල314ල271** | | **557ල074ල407** |

### 17.5.12. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

(අගයන් ආසන්නතම රුපියලට වටයා ඇත.)

| | වියදම | 2015 සිග | | 2014 සිග | |
|---|---|---|---|---|---|
| **ආදායම** | 12 | | | | |
| රජයේ ප්‍රදාන | | 64,000,000 | | 50,000,000 | |
| වෙනත් ආදායම් | | 217,162,867 | 281,162,867 | 166,415,127 | 216,415,127 |
| වත්කම් ක්‍රමක්ෂය කිරීම | | | 12,696,356 | | 10,398,675 |
| | | | 293,859,223 | | 226,813,802 |
| **වියදම** | | | | | |
| **පුනරාවර්තන වියදම්** | 13 | | | | |
| පුද්ගල පඩිනඩි | | 112,943,383 | | 83,850,623 | |
| ගමන් වියදම් | | 9,267,976 | | 8,632,373 | |
| සැපයුම් | | 7,243,017 | | 7,403,596 | |
| නඩත්තු කටයුතු | | 5,901,999 | | 2,923,260 | |
| ගිවිසුම්ගත සේවා | | 23,692,216 | | 21,014,609 | |
| වෙනත් පුනරාවර්තන වියදම් | | 66,995,900 | | 56,372,401 | |
| පශ්චාත් උපාධි පුහුණු වියදම් | | 15,109,133 | 241,153,624 | 15,700,120 | 195,896,982 |
| පාරිතෝෂික | | 2,035,728 | | 3,357,858 | |
| ක්ෂය කිරීම් | | 31,627,581 | 33,663,309 | 33,504,447 | 36,862,305 |
| **ආදායමට වැඩි වියදම් අතිරික්තය** | | | **19,043,290** | | **(5,945,485)** |

| | ආදායම සහ වියදම | 2014 රුපියල් | 2015 රුපියල් |
|---|---|---|---|
| | **ආදායම** | | |
| 1 | පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා ගමන් වියදම් ප්‍රදානය ද ඇතුළත්ව පුනරාවර්තන වියදම සඳහා රජයේ ප්‍රදානය | 50,000,000 | 64,000,000 |
| 2 | පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය මගින් උත්පාදනය කරන ලද ආදායම | 166,651,219 | 216,715,787 |
| | | 216,651,219 | 280,715,787 |
| | වත්කම් අපහරණය කිරීම | (236,092) | 447,079 |
| | | 216,415,127 | 281,162,866 |
| | වත්කම් ක්‍රමක්ෂය කිරීම | 10,398,675 | 12,696,356 |
| | | 226,813,802 | 293,859,222 |
| | **අඩු කළා - වියදම්** | | |
| 1 | ***පුනරාවර්තන වියදම්*** | | |
| 1ග1 | පුද්ගල පඩිනඩි | 83,850,623 | 112,943,383 |
| 1ග2 | ගමන් වියදම් සහ සංයුක්ත දීමනා | 8,632,373 | 9,267,976 |
| 1ග3 | සැපයුම් | 7,403,596 | 7,243,017 |
| 1ග4 | නඩත්තු කටයුතු | 2,923,260 | 5,901,999 |
| 1ග5 | ගිවිසුම්ගත සේවා | 21,014,609 | 23,692,216 |
| 1ග6 | වෙනත් පුනරාවර්තන වියදම් | 56,372,401 | 66,995,900 |
| 1ග7 | පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා ගමන් වියදම් ප්‍රදානය | 15,700,120 | 15,109,133 |
| 1ග8 | පාරිතෝෂිකය | 195,896,982 | 241,153,624 |
| | | 3,357,858 | 2,035,727 |
| | ක්ෂය කිරීම් | 33,504,447 | 31,627,581 |
| | | 232,759,287 | 274,816,932 |
| | **අතිරික්තය/(හිඟය)** | (5,945,485) | 19,043,290 |
| | **ප්‍රාග්ධන ප්‍රදානය** | | |
| 1 | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ නඩත්තුව | 2,000,000 | 5,000,000 |
| 2 | පරීක්ෂණාගාර, ඉගැන්වීම් හා කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ | 4,000,000 | -- |
| 3 | පුස්තකාල ග්‍රන්ථ හා වාරසඟරා | 20,000,000 | -- |
| 4 | උපාධි ලෝගු | -- | -- |
| 5 | රොඩ්නි වීදිය ව්‍යාපෘතිය සඳහා ඉඩම | 240,000,000 | |
| 6 | එෘසක ගොඩනැගිලි ව්‍යාපෘතිය | | 59,000,000 |
| | | 53,550,000 | 286,000,000 |
| | | 319,550,000 | 350,000,000 |

**17.5.13. 2015 වසර සඳහා මූල්‍ය වාර්තාව**

| | | | |
|---|---|---|---|
| 2 | ***ප්‍රාග්ධන වියදම්*** | | |
| 2.1 | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ නඩත්තුව | 981,344 | |
| 2.2 | පරීක්ෂණාගාර, ඉගැන්වීම් හා කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ | 5,067,857 | 5,117,319 |
| 2.3 | පුස්තකාල ග්‍රන්ථ හා වාරසඟරා | 13,687,150 | 9,122,923 |
| 2.4 | උපාධි ලෝගු | | 27,000 |
| 2.5 | රොඩ්නි වීදිය ව්‍යාපෘතිය සඳහා ඉඩම | 240,000,000 | |
| 2.6 | ඵැසෘක ගොඩනැගිලි ව්‍යාපෘතිය | | |
| 2.7 | රොඩ්නි වීදිය නව ගොඩනැගිල්ල | 9,160,500 | |
| 2.8 | ඉදිකිරීමේ ව්‍යාපෘතිය | | 10,819,390 |
| 2.9 | විදුලිය බෙදාහැරීම | | 3,540,429 |
| | | 268,896,851 | 28,627,061 |
| | ඉදිකිරීමේ වැඩ කටයුතු - ඵැසෘක ගොඩනැගිල්ල | 47,919,107 | 62,757,391 |
| | ඉදිකිරීමේ වැඩ කටයුතු - රොඩ්නි වීදිය | | 314,157,745 |
| | ඉදිකිරීමේ වැඩ කටයුතු - ප්‍රධාන ගොඩනැගිල්ල | | 9,882,582 |
| | | 47,919,107 | 386,797,718 |

## වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින්
## 2014 සිට 2015 දක්වා අභ්‍යන්තරව ජනනය කරන ලද ආදායම

| | **2014** | **2015** |
|---|---|---|
| ලියාපදිංචි ගාස්තු | 16,765,100 | 19,134,000 |
| පාඨමාලා ගාස්තු | 60,093,248 | 88,807,334 |
| විභාග ගාස්තු | 69,632,360 | 77,603,012 |
| වෙනත් | 26,039,923 | 31,618,520 |
| **එකතුව** | **172,530,631** | **217,162,866** |



18. **විගණන වාර්තා හා පිළිතුරු**

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එඑඊඩී/බී/පීජීඅයිඑම් /6/15/06

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2016 සැප්තැම්බර් 20 දි

DB

Institute of Medicine University of Colombo
23 SEP 2016
Director's Office

අධ්‍යක්ෂ,

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1980 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය නියමාවලියේ 20 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාවේ කෙටුම්පත මේ සමඟ එවා ඇත.

02. එම වාර්තාවේ සාවද්‍ය හෝ ඒකඟවිය නොහැකි හෝ ප්‍රසිද්ධ කිරීම මහජන යහපතට පටහැනි වන්නේ යැයි අදහස් කරන කරුණු කිසිවක් අත් නම් මෙම ලිපියේ දින සිට දින හතක් ඇතුළත මා වෙත දැන්වීමට කටයුතු කළයුතු අතර, මෙම කරුණු පිළිබඳ තවදුරටත් ඔබ සාකච්ඡා කිරීමට අදහස් කරන්නේ නම් ඒ බව දින තුනක් ඇතුළත මා වෙත දන්වන්නේ නම් මැනවි.

03. ඉහත සඳහන් පරිදි දින හතක් ඇතුළත ඔබෙන් පිළිතුරක් නොලැබුණොත් කෙටුම්පත් වාර්තාවේ සඳහන් කරුණුවලට ඔබ එකඟ වූ ලෙස සලකා එම වාර්තාව සදහම් කර ගෙන අවසාන වාර්තාව නිකුත් කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.

ජී. චන්ද්‍රපාල

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

Postgraduate Institute of Medicine University of Colombo
23 SEP 2016
Accounts Branch

පිටපත් :-
01. ලේකම් - මුදල් අමාත්‍යාංශය
02. ලේකම් - උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
03. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
04. උපකුලපති - කොළඹ විශ්වවිද්‍යාලය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

රහස්‍යයයි

කෙටුම්පත

එච්ඊඩී/බී/පීජීඅයිඑම් /6/15/06 2016 සැප්තැම්බර් දින

අධ්‍යක්ෂ,

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1980 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය නියමාවලියේ 20 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1980 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතතාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැකසීමට මා විසින් ලබාගෙන ඇති සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 02. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

පසුව ඉදිරිපත් කරනු ලැබේ

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

---

<u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01</u>

ආයතනයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති ඉඩම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය ප්‍රතිඵලය රු 5,945,485 ක ඌනතාවයක් වුවත් සංසන්දනාත්මක මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමේදී පසුගිය වර්ෂයේ ඌනතාවය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි රු 7,349,608 ක් ලෙස හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය රු 5,945,485 ක් ලෙස දක්වා තිබුණි. ඉකුත් වර්ෂයේ වැරදි නිවැරදි කර තිබුණද ඒ අනුව සංසන්දනාත්මක තොරතුරු නැවත ඉදිරිපත් කිරීමක් ලෙස දක්වා නොතිබුණි.

(ආ) ආයතනයෙහි පොදු ලෙජරයෙහි පවත්වාගෙන යන තොග ගිණුම් අනුව තොග ශේෂය රු 1,977,100 ක් හා භෞතික තොග සත්‍යාපනය අනුව තොග ශේෂය රු 1,973,342 ක් වන නමුත් මෙම අගයන් දෙකම නොසලකා තොගය රු 1,913,474 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඇ) 2014 වර්ෂය තුළ අපහරණය කරන ලද භාණ්ඩ අලෙවි කිරීමෙන් ලද චෙක්පතක් ගිණුම්ගත කිරීමකින් තොරව බැංකු ගත කර තිබුණි. මෙම චෙක්පත අගරු වී තිබූ අතර අගරු ගාස්තු ලෙස බැංකුව අයකල රු 65 ක් හේතුවෙන් ගිණුම් නොසැසඳීම නිවැරදි කිරීම සඳහා 2015 ජනවාරි සිට බැංකු සැසඳුම් ප්‍රකාශය තුළ චෙක්පතෙහි අගය වූ රු 23,814 ක් හඳුනා නොගත් තැන්පතු ලෙසත් අගරු ගාස්තු සමඟ චෙක්පතේ අගය වූ රු 22,879 ක් හඳුනානොගත් ගෙවීම් ලෙසත් දක්වා ඇති අතර 2015 දෙසැම්බර් 31 දින දක්වා අදාල ආයතනය තුළින් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ආයතනය විසින් පවත්වනු ලබන සෑම පාඨමාලාවකම ලියාපදිංචි ගාස්තුව රු 3000 ක් වන අතර 2015 වර්ෂයේ ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව 980 කි. ඒ අනුව වර්ෂයට අදාල ලියාපදිංචි ගාස්තු ආදායම රු 2,940,000 විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන තුළ ලියාපදිංචි ගාස්තු ආදායම

ලෙස රු 3,285,250 ක් දක්වා තිබීම හේතුවෙන් වසරේ අතිරික්තය රු 345,250 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ආයතනය විසින් පවත්වනු ලබන සියලුම විභාග වල විභාග ලියාපදිංචි ගාස්තුව රු 4000 ක් වන අතර 2015 වර්ෂයේ විභාග සඳහා පෙනී සිටි සිසුන් සංඛ්‍යාව 4040 කි. ඒ අනුව වර්ෂයට අදාල විභාග ගාස්තු ආදායම රු 16,160,000 ක් විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන තුළ විභාග ලියාපදිංචි ගාස්තු ආදායම් ලෙස රු 16,552,500 ක් දක්වා තිබීම හේතුවෙන් වසරේ අතිරික්තය රු 392,500 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ආයතනයෙහි බැංකු ගිණුම වෙත සෘජුවම තැන්පත් කර ඇති එකතුව රු 1,035,067 ක අවිනිශ්චිත ශේෂයක් නිසි හඳුනාගැනීමකින් තොරව රු 726,567 ක් පාඨමාලා ගාස්තු, රු 163,000 ක් ලියාපදිංචි ගාස්තු හා රු 145,500 ක් විභාග ගාස්තු ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි 371 | (අ) අත්තිකාරමක් ලබාදීම හුදෙක් මාණ්ඩලික සේවයේ නිලධාරීන්ට පමණක් සීමා වියයුතු වුවත් මාණ්ඩලික නොවන නිලධාරීන් 32 දෙනෙකු වෙත අවස්ථා 716 ක දී එකතු වටිනාකම රු 13,601,387 ක අත්තිකාරම් ලබාදී තිබුණි.<br>(ආ) අදාල කාර්යය නිමවූ වහාම ලබාගත් අත්තිකාරම පියවිය යුතු වුවත් අවස්ථා 4ක දී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු 93,850 ක අත්තිකාරම් පියවීම දින 37 සිට දින 187 දක්වා කාලයක් ප්‍රමාදකර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.8.1 | ලංසු ඇගයීමට පත්කරන තාක්ෂණික ඇගයීම් කමිටු තුළ අදාල විෂය සම්බන්ධ විශේෂඥයෙකු ඇතුළත් විය යුතු වුවත් ආයතනය ඇතැම් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් විශේෂඥයෙකු රහිත තාක්ෂණික ඇගයීම් කමිටු සකසා තිබුණි. |

### 2.2.4 නොසැසඳීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන වලට අනුව ගිණුම් වර්ෂය අවසාන දිනට දේපළ පිරියත හා උපකරණ වල ධාරණ අගය රු 376,137,575 ක් වුවද ස්ථාවර වත්කම් ලේඛනයට අනුව දේපළ පිරියත හා උපකරණ වල ධාරණ අගය රු 297,852,224 ක් වීම හේතුවෙන් ගිණුම්ගතවී ඇති වත්කම් හා භෞතික වත්කම් අතර රු 78,285,350 ක වෙනසක් පැවතුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව ආපදා ණය ශේෂය හා කේවල ශේෂ ලැයිස්තුව අනුව ණය ශේෂය අතර රු 3,282 ක වෙනසක් පැවතුණි.

(ඇ) කේවල ශේෂ ලැයිස්තුව අනුව ණය හිමියන්ගේ එකතුව රු 7,532,893 ක් වන අතර මූල්‍ය ප්‍රකාශන තුළ ණය හිමියන් රු 7,527,343 ක් වන බැවින් රු 5,550 ක වෙනසක් පැවතුණි.

### 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිවිසුම පරිදි අදාල කාලය තුළ නිෂ්පාදන දෝෂ පවතී නම් ඒවාට අදාල අඩු කිරීම් සිදුකර, නිම කරන ලද කොන්ත්‍රාත් වලින් රඳවාගත් මුදල් කාලසීමාව අවසානයේ අදාල කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදිය යුතු වුවත් නිෂ්පාදන දෝෂ පිළිබඳ කිසිදු ඇගයීමක් සිදු නොකර වසර 2 සිට 6 දක්වා එකතුව රු 323,700 ක රඳවා ගැනීමේ මුදල් තවදුරටත් රඳවාගෙන තිබුණි.

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් වසර 05 කට වැඩි කාලයක සිට ලැබිය යුතු පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තු රු 4,046,625 ක් සහ ගොඩනැගිලි කුලී රු 981,625 ක් වශයෙන් එකතුව රු 5,028,250 ක මුදලක් 2016 අගෝස්තු දක්වා අයකරගෙන නොතිබුණි.

## 2.2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගෙවීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2014 මැයි 02 සිට උපදේශක තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පුද්ගලයකු පත්කර 2014 හා 2015 වර්ෂයන්හිදී පිළිවෙලින් රු 326,400 ක් හා රු 416,600 ක දීමනා ලබාදී තිබුණි.

(ආ) අධ්‍යයන කමිටුව මගින් ගන්නා ලද තීරණ නැවත සලකා බැලීම සඳහා Academic, Affairs, Accreditation, Examinations & Discipline (AAAED) නම් කමිටුවක් ස්ථාපිත කර සෑම මසකම රැස්වීමක් පවත්වා චක්‍රලේඛ ප්‍රතිපාදන රහිතව හා විධිමත් අනුමැතියකින් තොරව සාමාජිකයෙකුට රු 2000 බැගින් ගිණුම් වර්ෂය තුළ රු 126,000 ක දීමනා කමිටු සාමාජිකයන් වෙත ලබාදී තිබුණි.

## 2.2.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පවත්වාගෙන යන පාඨමාලා 2 ක පාඨමාලා අධ්‍යක්ෂ ලෙස කොන්ත්‍රාත් පදනම මත එකම පුද්ගලයෙකු පත්කර තිබූ අතර පත්වීමේ ලිපිය අනුව එක් තනතුරක් සඳහා දිනකට පැය 04 ක් සේවය කල යුතු වේ. ඒ අනුව තනතුරු දෙකකහි රාජකාරී ආවරණයට පැය 08 ක් සේවයේ යෙදිය යුතු වුවත් සේවය කල බව තහවුරු කිරීමට පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබීම හේතුවෙන් ගිණුම් වර්ෂය තුළ ගෙවා තිබූ රු 570,000 ක් වූ දීමනා තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) ගිණුම් වර්ෂය තුල යන්ත්‍ර හා උපකරණ සේවා කිරීම වෙනුවෙන් ආයතන 06 ක් වෙත රු 655,105 ක් ගෙවා තිබුණද අදාල සේවාවන් සිදුකරවාගෙන නොතිබීම හේතුවෙන් එම වියදම නිෂ්කාර්යය වී තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන තුළ වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ යටතේ රු 523,345 ක ශේෂය අත්තිකාරම් ගැලපුම් නමින් ජංගම වත්කමක් දක්වා ඇති අතර 2012 වර්ෂයේදී ගිණුම්ගත කොට ඇති මෙම ශේෂය සත්‍යාපනය කරගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොවුණි.

## 03. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය, රු 19,043,315 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු 5,945,485 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු 24,988,800 කින් වර්ධනයක් පෙන්නුම් කෙරේ. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආයතනයේ මෙහෙයුම් වියදම් රු 45,255,617 කින් වැඩි වී තිබුණද පුනරාවර්තන වියදම් සඳහා, රාජ්‍ය ප්‍රදාන හා වෙනත් ආදායම් රු 64,747,740 කින් වැඩිවීම මෙම වර්ධනයට හේතු වී තිබුණි.

ඉකුත් වර්ෂ 5 තුළ මූල්‍ය ප්‍රතිඵල සමාලෝචිත කිරීමෙන් 2011 හා 2014 වර්ෂ වලදී මූල්‍ය ප්‍රතිඵල වල ඌණතාවයක් පෙන්නුම් කල නමුත් අනෙකුත් වර්ෂ වල අතිරික්තයක් ලබා තිබුණි. සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු සහ ස්ථාවර නොවන වත්කම් සඳහා ක්ෂය ගැලපීමෙන් පසු ආයතනයේ සමස්ථ දායකත්වය 2011 වර්ෂයේ සිට 2015 දක්වා අඛණ්ඩව වර්ධනයක් පෙන්නුම් කර තිබූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එම වර්ධනය සියයට 47 ක් විය.

## 04. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පවත්වාගෙන යන ස්ථාවර වත්කම් ලේඛනය තුළ රු 257,279 ක් වටිනා ශීතකරණ 9 ක් ඇතුලත් වී ඇතත් ඉන් ශීතකරණ 3 ක් අස්ථානගත වී ඇති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. අස්ථානගත ශීතකරණ සම්බන්ධයෙන් ආයතනය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටා ඇති, සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් හෙක්ටයාර් 0.2074 ක් වූ ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉඩම්, ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා 2014 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් වෙත රු 26,250 ක් ගෙවා තිබුණද ගිණුම් වර්ෂය අවසන් දින දක්වා ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) පිරිවැය රු 159,925,550 ක් දරා නව ගොඩනැගිල්ලක් ඉදිකර අවසන් කර තිබු නමුත් ඉදිකිරීම් සැලැස්ම අකාළඹ මහ නගර සභාවෙන් අනුමත කරවාගෙන නොතිබුණි. නගර සභාවට අනුව මෙම ඉදිකිරීම සිදුකල ස්ථානයේ ඇති අනෙකුත් ගොඩනැගිලි හා මෙම ගොඩනැගිල්ල අතර පැවතිය යුතු නියමිත ඉඩ ප්‍රමාණයන් පිළිබඳව සැලකිල්ලක් නොදක්වා ඉදිකිරීම් සිදුකර තිබීම හේතුවෙන් සැලැස්ම අනුමත කරවා ගැනීමට දඩ මුදල් ගෙවීමේ හෝ නියමිත ඉඩ ලබාගැනීමට ගොඩනැගිලි වල කොටසක් ඉවත් කිරීමේ අවදානමක් හා ආයතනයට විරුද්ධව නිත්‍යානුකූල පියවර ගැනීමට ද අවදානමක් පවතී.

(ඊ) ආයතනය ගබඩා භාරකරුට එරෙහිව 2013 පෙබරවාරි මාසයේදී විනය පරීක්ෂණයක් ආරම්භ කර වසර 03 1/2 කට අධික කාලයක් ගත වී ඇතත් පරීක්ෂණ අවසන් කර නොතිබුණි.

(ඊ) සේවකයින් වෙත විදේශගත වීම සඳහා අනුමැතිය ලබාදීමට පෙර ආයතනයට අයවිය යුතු සියලුම ශේෂ අයකර ගත යුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස රු 7,514 ක ණය ශේෂයක් සහිත සේවකයින් දෙදෙනෙකු වෙත විදේශගත වීමේ අවස්ථාව ලබා දීම තුළ ඔවුන් නැවත ලංකාවට නොඑම හේතුවෙන් ගිණුම් වර්ෂය අවසන් වන විටත් මෙම ණය ශේෂය අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(උ) උපායශීලී සැලැස්ම (Strategic Plan) හා ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) අනුව ආයතනයේ කටයුතු සිදුවන බව තහවුරු කෙරෙන ප්‍රගතිය දැක්වෙන වාර්තා පිළියෙල කර නොතිබීම තුළ ඉහත සැලසුම් ලේඛන වලට පමණක් සීමා වී තිබුණි.

(ඌ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2015 අනුව බාහිර කථිකාචාර්යවරුන්ට අදාල ගමන් වියදම් හා ඉන්ධන දීමනා ලබාදී තිබියදී නිසි අනුමැතියකින් තොරව 2015 ජනවාරි මාසය තුළ එකතුව රු 87,975 ක සංයුක්ත දීමනා ගෙවා තිබුණි. සංයුක්ත දීමනා සඳහා වෙනම ලේඛනයක් පවත්වා නොගැනීම හේතුවෙන් 2015 වර්ෂයට අදාල මුළු දීමනා ප්‍රමාණය ගණනය කළ නොහැකි විය.

4.2 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පවත්වාගෙන ගිය ජංගම ගිණුම වසර 08 කට වැඩි කාලයක සිට අක්‍රීයව තිබු අතර සමාලෝචිත වර්ෂයේ අවසානයේ එහි ශේෂය වූ රු 43,479 ක් විය.

(ආ) පර්යේෂණ කටයුතු වෙනුවෙන් 2013 වර්ෂයේදී ලද රු 3,913,400 ක ප්‍රදානයක් ගිණුම් වර්ෂය අවසාන දින දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

### 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

ආයතනය විසින් 2014 වර්ෂය තුළ සිසුන් 73 දෙනෙකුට හා 2015 වර්ෂය තුළ සිසුන් 39 දෙනෙකුට රු 3000ක් වූ ලියාපදිංචි ගාස්තු අයකිරීමකින් තොරව පාඨමාලා වලට සහභාගී වීමට අවස්ථාව ලබාදී තිබූ අතර ගිණුම් වර්ෂය අවසන් දින දක්වා ඔවුන්ගෙන් අයවිය යුතුව තිබූ රු 336,000 ක හිඟ ලියාපදිංචි ගාස්තු අයකර ගෙන නොතිබුණි.

### 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---

කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් 38 දෙනෙකු වෙත රාජකාරි වේලාව තුළ ආයතනයේ බාහිර දේශන ලබාදී එකතු වටිනාකම රු 391,000 ක දීමනා ගෙවා තිබුණි.

### 4.5 කොන්ත්‍රාත් පාලනය

---

ප්‍රධාන ගොඩනැගිල්ලෙහි පළමු මහලේ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියාව සඳහා වූ ටෙන්ඩරය ප්‍රදානයේදී අවම මිල ගණන් ලෙස රු 2,441,970 ක් ලබාදී තිබූ ටෙන්ඩර්කරු වෙනුවට රු 2,969,790 ක දෙවන මිල ලබාදී තිබූ ටෙන්ඩර්කරු තෝරාගෙන තිබීම හේතුවෙන් ආයතනයට රු 527,820 ක පාඩුවක් සිදු වී තිබුණි. අවම මිල ඉදිරිපත් කර ආයතනයට පෙර පළපුරුද්දක් නොමැති වීම ටෙන්ඩරය ලබා නොදීමට හේතුව ලෙස දක්වා තිබුණද ඊට මාස 04 කට පසුව එම ආයතනය වෙත රු 11,961,740 ක වටිනා වෙනත් ටෙන්ඩරයක් ප්‍රදානය කර තිබුණි.

### 4.6 හඳුනාගන්නා ලද පාඩු

---

2006 සිට 2014 වර්ෂය දක්වා කාර්යය පැවරුම් පදනම මත බඳවාගෙන තිබුණු සේවකයන් 12 දෙනෙකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් නොගෙවීම හේතුවෙන් ඉහත කාලයට අදාළ සේවකයන්ගෙන් අයකර ගැනීමකින් තොරව දායකත්වය රු 793,778 ක් හා රු 1,073,707 අධිභාරයක් ලෙස එකතුව රු 1,867,475 ක් ගෙවා තිබුණි.

## 05. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය

දේපල අයිතිය තහවුරු කර නොගැනීම, නඩත්තු කිරීම හා අපහරණය පිළිබඳ දුර්වලතා පැවතීම

(ආ) අත්තිකාරම් පාලනය

සීමාව නොපිළිපැදීම, නියමිත කාලයට පිරවුල් නොකිරීම

(ඇ) බැංකු හා මුදල්

චෙක්පත් අවලංගු කිරීම, නැවත නිකුත් කිරීම හා ඒ සඳහා පියවුම් තැබීම

ගාමිණී විජේසිංහ

විගණකාධිපති

# Postgraduate Institute of Medicine
University of Colombo, Sri Lanka

*rofessor H. Janaka de Silva*
D,DPhil(Oxon),FRCP,FCCP,FNAS(SL)
**irector**

AB/C/GA/2015

2016/11/28

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව ,

**කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1980 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය නියමාවලියේ 20 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඒවා ඇති අංක එච්ඊ/බී/පීජීඅයිඑම්/6/15/06 හා 2015 සැප්තැම්බර් 23 දිනැති විගණන විමසුම් වාර්තාව සම්බන්ධයෙන් ගන්නා ලද හා ගැනීමට යෝජිත පියවරයන් මේ සමඟ කාරුණිකව ඉදිරිපත් කරමි.

H-J cecdcl

අධ්‍යක්ෂ,
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

Professor H. Janaka de Silva
MD, DPhil.(Oxon.) FRCP
Director
Postgraduate Institute of Medicine
University of Colombo.

පිටපත්,

1. ලේකම් - මුදල් අමාත්‍යාංශය
2. ලේකම් - මහාමාර්ග,උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
3. සභාපති - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති - කොළඹ විශ්ව විද්‍යාලය
5. අභ්‍යන්තර විගණක - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. ජ්‍යේෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක - කොළඹ විශ්ව විද්‍යාලය

neral Office: 160, Prof. Nandadasa Kodagoda Mawatha, Colombo 07, Sri Lanka. Tel: +94 11 2697758/2696261/2681052 Web: www.pgim.cmb.ac.lk
rector
l :+94 11 2688649
x :+94 11 2697757
nail: director@pgim.cmb.ac.lk
Academic Branch
Tel: +94 112687806/2687511
Fax: +94 11 2687050
academic@pgim.cmb.ac.lk
Exam Branch
Tel: +94 11 2683467/2696258
Fax: +94 11 2687803
exam@pgim.cmb.ac.lk
pgimint@pgim.cmb.ac.lk
Library
Tel: +94 11 2671047
Fax: +94 11 2687050
library@pgim.cmb.ac.lk
Medical Education Resource Centr
Tel: +94 11 2689266
Fax: +94 11 2689268
merc@pgim.cmb.ac.lk

(7)

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

විගණන විමසුම සටහන් කර ගන්නා ලදී.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන කාර්යාලය පිහිටි භූමිය තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.මෙය ඉතා දිගු වැඩ පිළිවෙලක් වන අතර මෙම කාර්යයෙන් 90% පමණ නිමකර ඇත.ඒ අනුව තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට 2016 වර්ෂයේදී කටයුතු කරනු ලැබේ.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) විගණන විමසුම සටහන් කර ගන්නා ලදී..මෙම කාරුණ පරීක්ෂා කර බලා 2016 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) මෙම පාඨමාලා ගාස්තු ලියාපදිංචි ගාස්තු හා විභාග ගාස්තු කිනම් පාඨමාලාවකට හෝ විභාගයකට ලෙස වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට අපහසු වී තිබුණි. 2017 ජනවාරි සිට මාර්ගගත ගෙවීම් ක්‍රමය (Online Payment) භාවිතා කිරීමට කටයුතු සලසා ඇති බැවින් මෙම ගාස්තු නිසියාකාරව හඳුනා ගැනීමට ඉදිරියේදී හැකි වනු ඇත.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) අධ්‍යන පාඨමාලාව අධ්‍යක්ෂක ( සොෆ්ට්වෙයාර් පද්ධති ) යනු වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරකි.අධ්‍යන කාර්ය මණ්ඩලය පැමිණීම හා පිටවීම සටහන් කිරීමක් නොකරන අතර (විශ්ව විද්‍යාල පද්ධතියේම අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීම පිටවීම සටහන නොකරයි) පාඨමාලා 2 ක් සඳහා උක්ත පාඨමාලා අධ්‍යක්ෂවරිය පැය 08 ක රාජකාරි සිදු කරයි.කෙසේ නමුත් 2016 ඔක්තෝම්බර් මස සිට ඇයගේ පැමිණීම හා පිටවීම තහවුරු කිරීම උදෙසා ඇය විසින් දින පොතක් පවත්වාගෙන යනු ලබයි.

(ආ) නොග අත්තිකාරම් ගැලපුම් ලෙස පෙන්වා ඇති රු.523,345 ක් වූ ශේෂය 2016 වර්ෂයේදී නිවැරිදි කිරීමට කටයුතු කරනු ලැබේ.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

(අ) විගණන විමසුම් හා එකඟ වෙමි.මූල්‍ය ප්‍රකාශනවල දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගය හා ස්ථාවර වත්කම් ලේඛනයේ අගය අතර වෙනස ඇති වී ඇත්තේ ස්ථාවර වත්කම් ලේඛනයට ලබාගත් උපකරණවල අගය හා වටිනාකම මතය.මෙම වෙනස 2016 වසර තුලදී හැකිතාක් දුරට අවම කිරීමට කටයුතු කරමින් පවතී.

### 2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

(අ) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ගිවිසුම් පරිදි අදාල කාලය තුල නිෂ්පාදන දෝෂ පැවතියේනම් එම දෝෂ නිවැරදි කර ඇත.නමුත් රඳවා ගත් මුදල් අදාල කොන්ත්‍රාත්කරුවන් වෙත නිකුත් කරනුයේ ඔවුන් ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබූ පසුය.අදාල ගිවිසුම් ගත කාලය අවසන් වී ඇතත් සමහර කොන්ත්‍රාත්කරුවන් විසින් ලිඛිතව රඳවා ගත් මුදල් ආපසු ඉල්ලීමක් සිදු කරනු ලබා නැත.නමුත් මේ වන විට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,එම කොන්ත්‍රාත්කරුවන් උක්ත මුදල් නිදහස් කිරීම සඳහා ලිඛිතව ඉල්ලුම් කරන මෙන් දන්වා ඇත.

(ආ) මෙය ජංගම ගිණුමේ ශේෂයක් නොව මහජන බැංකුවේ වඩුන්හේල් ශාඛාවෙන් ලැබිය යුතු මුදලකි.මෙය විසඳා ගැනීමට දැනටමත් කටයුතු කර ඇත.

### 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

(අ) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විභාග අංශයේ අනුමත කාර්ය මණ්ඩලය තුල මාණ්ඩලික නිලධාරී තනතුරු 2ක් ඇතත් , එම අංශයේ පවතින අධික රාජකාරි කටයුතු ,විශේෂයෙන් රහස්‍ය රාජකාරි කටයුතු සඳහා නිලධාරීන් දෙදෙනෙකු ප්‍රමාණවත් නොවේ.තවද 2014 වර්ෂය වන විට විභාග අංශයේ පැවති යම් ගැටළු මත වෛද්‍යවරු නීති මගට පිවිස සිටියහ.තව දුරටත් 2014 වර්ෂය වන විට විභාග අංශයට අනුමත කාර්ය මණ්ඩලය ලෙස නව ජේෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුරක් ලැබී තිබුණද නව ජේෂ්ඨ සහකාර ලේඛකාධිකාරී පත් කිරීම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව මගින් ඒ අවස්ථාවේ සිදු නොවීණි.

උක්ත කරුණු සලකා බලා කළමනාකරණ මණ්ඩලයේ තීරණය පරිදි ආයතනයේ අයපයිම වලින් ගෙවීමේ පදනම මත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විභාග අංශයේ සේවය කල ඉතාම පළපුරුදු නිලධාරියෙකු වූ එස්.එම්.බොංජ්ජු මහතා පැවරුම් පදනම මත උපදේශක තනතුරක් සඳහා බඳවා ගන්නා ලදී.

(ආ) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අධ්‍යයන කටයුතු,පිළිගැනීම් හා විභාග පිළිබඳ ස්ථාවර (AAAEC ) ස්ථාපිත කිරීම සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය 01.04.2006 දින ලැබී තිබූන අතර, මාසික රැස්වීමේ දීමනාව ලෙස එක් සමාජිකයෙකුට රු.2000.00 ක් ගෙවීමට 2012/09/08 දින අනුමැතිය දී ඇත.මෙම ආයතනයේ ව්‍යවස්ථාවේ 12(3) n පරිච්ඡේදයට අනුව කළමනාකරණ මණ්ඩලයට අවශ්‍යතාවය මත නව කමිටු ස්ථාපිත කිරීමේ බලය පවරා ඇත.

2.5 <u>නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික
සමාජවාදී ජනරජයේ
මුදල් රෙගුලාසි සංග්‍රහය
මුදල් රෙගුලාසි 371 (අ) [i]

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ,ශ්‍රී ලංකාවේ වෛද්‍ය විද්‍යාවට අදාල පශ්චාත් උපාධි පාඨමාලා පවත්වන එකම ආයතනය වේ.එබැවින් මෙම ආයතනය තුල වර්ෂය පුරාවටම විභාග 136 ක් පමණ පවත්වන අතර එම විභාග ලිඛිත, වාචික හා සායනික යන තුන් ආකාරයෙන්ම පැවැත්විය යුතුය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විභාග අංශයේ රාජකාරි කටයුතු සිදු කරනුයේ සහකාර ලේඛකාධිකාරීවරියන් දෙදෙනෙකු පමණක් වන අතර ඉන් එක් නිලධාරිනියක් වෛද්‍යවරුන්ගේ විදේශ පුහුණුව හා මණ්ඩල සහතිකකරණය සම්බන්ධ කටයුතු පමණක් සිදු කරයි.විභාග කටයුතු සිදු කරනුයේ එක් නිලධාරිනියක් විසින් පමණි.එබැවින් වර්ෂය පුරා දිවෙන විභාග 136 අත්තිකාරම් ලබා ගැනීම් එක් මාණ්ඩලික නිලධාරිනියකට පමණක් සිදු කිරීම ඉතාම අපහසු කටයුත්තක් වේ. එබැවින් විභාගයට අදාල විෂය ලිපිකරුට එම අත්තිකාරම් ලබා ගැනීම සඳහා අවසර දී ඇත්තේ මෙම ආයතනයේ එදිනෙදා කටයුතු නිසියාකාරව පවත්වාගෙන යාමට වන අතර,අදාල මාණ්ඩලික නිලධාරිනියගේ අධීක්ෂණය යටතේ අත්තිකාරම් ලබා ගැනීම සිදු කරනු ලබයි.

| | | |
|---|---|---|
| | [ii] | ඇතැම් විට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් පිට විභාග පැවැත්වේ. මෙම විභාග පේරාදෙණිය ,කරාපිටිය,රාගම වැනි වෙනත් වෛද්‍ය පීඨ වල පැවැත්වෙන විට අදාල ලිපිකරු / පරිගණක යෙදුම් සහකාර විසින් ගන්නා අත්තිකාරම් මුදල් විභාග සම්බන්ධීකාරක විශේෂඥ වෛද්‍යවරුන් වෙත ලබා දීමට සිදු වේ විභාගය අවසන් වීමෙන් පසු ඔවුන් විසින් අදාල බිල්පත් සමග ඉතිරි මුදල් විභාග අංශය වෙත ලබා දිය යුතුය.එක් විභාගයක් පවත්වා අවසන් කිරීමට සති තුනක පමණ කාලයක් ගත වන අතර දැනුවත් කිරීම් සිදු කලද අදාල සම්බන්ධීකාරක වෛද්‍යවරුන් බිල්පත් ලබා දීම ප්‍රමාද වන අවස්ථා ඇත.එවැනි අවස්ථා වල ලබා ගත් අත්තිකාරම පියවීම ප්‍රමාද වීම සිදු වේ.කෙසේ වෙතත් අනාගතයේදී විභාගය අවසන් වී සති දෙකක් ඇතුලත මුදල් හා බිල්පත් නිසි ආකාරව පියවීම හා භාරදීම සිදු කරන මෙන් අදාල සම්බන්ධීකාරක වෛද්‍යවරුන් දැඩිව දැනුවත් කර ඇත. |
| (ආ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | සමස්ත විශ්ව විද්‍යාල පද්ධතිය තුල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සටහන් කිරීමට අත්සන් තැබීමක් හෝ ඇඟිලි සලකුණු තැබීමක් සිදු නොවේ.<br>කෙසේ වෙතත් අදාල කාර්ය මණ්ඩලය මේ සම්බන්ධයෙන් දැනුවත් කර ඇත. |
| (ඇ) | 2015 ජනවාරි 22 දිනැති අංක 01/2015 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය | විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහය අංක viii - 8.5 යටතේ ඇති ප්‍රතිපාදන වලට අනුකූලව බාහිර කථිකාචාර්ය වරුන් සඳහා සංයුක්ත දීමනාව ගෙවීම කරනු ලැබේ. |
| (ඈ) | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පවත්වන සෑම විභාගයකම ලිඛිත,වාචික මෙන්ම සායනික පරීක්ෂණ පැවැත්වීම අනිවාර්ය වේ.සායනික පරීක්ෂණ රජයේ ශික්ෂණ රෝහල්වල පවත්වන |

අතර එම විභාගය සඳහා අදාල රසායනික ද්‍රව්‍ය සැපයීම මෙන්ම රජයේ රෝහල් වලට සම්බන්ධ රෝගීන් හා රෝහල් කාර්ය මණ්ඩලය පවා සහභාගී කරවා ගැනීමට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට සිදු වේ. තවද එක් විභාගයක් සති කීපයක් තිස්සේ පැවැත්වීමට සිදු වන අවස්ථා ඇත. කිසිදු බාධාවකින් තොරව විභාග පැවැත්වීමට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය බැඳී ඇති බැවින් රු.100,000 උපරිම අත්තිකාරමකට යටත්ව විභාග පැවැත්වීම අපහසු වේ.

(ඉ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.8.1 වගන්තිය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සියලුම කොන්ත්‍රාත් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු සකසා ඇත. හැකි තාක් දුරට ආයතනයේ කාර්ය මණ්ඩලය තුලින් විශේෂඥ සහය ලබා ගැනීමට කටයුතු සිදු කරන අතර ආයතනය තුලින් අදාල විශේෂඥ සහය ලබා ගැනීමට නොහැකි අවස්ථාවල වෙනත් ආයතන වලින් එවා විශේෂඥ සහය ලබාගෙන ඇත. උදාහරණ ලෙස වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නව ගොඩනැගිල්ලේ ජාලගත කිරීමේ (Network) සඳහා අප ආයතනයෙන් මෙන්ම University Of Colombo School Of Computing හි විශේෂඥයින් දෙදෙනෙකුගේද සහය ලබා ගන්නා ලදී. නමුත් විශේෂඥයකු ඇතුලත් වීම අත්‍යවශ්‍ය නොවන ආරක්ෂක සේවා, ආපනශාලා සහ පිරිසිදු කිරීම් වැනි කොන්ත්‍රාත් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ආයතනයේ මණ්ඩලීය නිලධාරීන්ගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කරනු ලබයි.

## 03 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

විගණන විමසුම හා එකඟ වෙමි .ආයතනයේ පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 64 ක මුදලක් රජයේ මුදලින් ලැබුණු අතර එය ආයතනයේ අනුමත ස්ථිර සේවයේ යෙදී සිටින අයගේ වැටුප් ගෙවීමට එය ප්‍රමාණවත් නොවූ අතර අනෙකුත් සෙසු වියදම් ආයතනයේ ඉපයීම ආදායම මගින් ගෙවීමට සිදු වී ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) එම එක් එක් යන්ත්‍ර හා උපකරණ අදාළ සේවා ගිවිසුම් මත මාස 03 කට වරක් සේවා කිරීම සිදු කරන අතර එම කටයුත්ත අවසන් කළ පසු සේවා කිරීම සතුටුදායක ලෙස සිදු වූ බව සහතික කරමින් නිකුත් කරන රිසිට්පත අංශ ප්‍රධානියා විසින් ගොනු ගත කරනු ලැබ ඇත.ගෙවීම් වලට අදාල සේවා කිරීම නිසි අයුරින් සිදු වේ.

(ආ) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2010.11.13 දින ලේකම්,උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති ලිපියෙන් ඉඩමේ නිරාකුල අයිතිය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට පවරා ගැනීමට අවසර ඉල්ලා ඇත.නමුත් ඉඩම් කොමසාරිස්ගේ 2016.08.26 දිනැති ලිපියෙන් අයිතිය පැවරීම වෙනුවට දීර්ඝ කාලීන බද්දකරයක් ලෙස ඉඩම වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට පවරා ඇත.කෙසේ වෙතත් යථා කාලයේදී නැවතත් ඉඩම මෙම ආයතනයේ අයිතියට පවරා ගැනීම වෙනුවෙන් අභියාචනයක් ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.

(ඇ) ඉඩමේ ගොඩනැගිලි තක්සේරු කිරීම පෞද්ගලික සමාගමක් හරහා නොව තක්සේරු දෙපාර්තමේන්තුවට යවා ඇති අතර මේ වන විට එය සිදු කෙරෙමින් පවතී.

(ඈ) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නව පාඨමාලා ආරම්භ කිරීම හා බඳවා ගැනීම් පුළුල් කිරීම මත (සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ) පැවති ඉඩකඩ පහසුකම් අවම වීම නිසා හැකි ඉක්මනින් මෙම ගොඩනැගිල්ල ඉදි කිරීමට සිදු විය.නාගරික සංවර්ධන අධිකාරියේ වාචික අවසරය මෙම සැලැස්ම සඳහා ලැබී තිබුණු අතර මේ වන විට කොළඹ මහා නගර සභාවෙන් සැලැස්ම අනුමත කරවා ගැනීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

(අ) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුහුණුව ලබන වෛද්‍යවරුන්ට පාඨමාලා සඳහා ලියාපදිංචි ගාස්තු ගෙවීම සිදු කරන මෙන් දැන්වන්නේ පාඨමාලා ගාස්තුව සමඟ,පාඨමාලාව ආරම්භයට ප්‍රථමයෙන්ය.එසේ නොගෙවන්නේ නම් මාස 06 කට වරක් සිහි කැඳවීමද සිදු කරනු ලබයි.නමුත් සමහර වෛද්‍යවරුන් එම ගෙවීම් සිදු කරනු ලබන්නේ අවසන් විභාගයට පෙරය.අදාල ගෙවීම සිදු කරන තෙක් විභාගයට අදාල පිවිසුම් ලේඛනය (Admission Card ) ලබා ගත නොහැක.උක්ත වෛද්‍යවරුන් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට පූර්ණ වශයෙන් මුදා හැරෙති.ඔවුන්ට පාඨමාලාවලට සහභාගී වීම අවහිර කිරීම සදාචාරාත්මක නොවන බැවින් හා මෙම ආයතනය තුල නොව පිටස්තර රෝහල්වල

ඔවුන්ගේ පුහුණු වීම සිදු කරන බැවින් සෑම මාස 06 කට වරක් අදාළ මුදල් ගෙවීමට සිහි කැඳවීම පමණක් සිදු කරයි.කෙසේ වෙතත් ගෙවීම් පිළිබඳ ගැටළු මගහැරවීම උදෙසා 2017 ජනවාරි 01 වැනිදා සිට සියලු ගෙවීම් පරිගණකගත කිරීම සිදු කරයි.එහිදී ලියාපදිංචි ගාස්තුව අදාළ සාමාජිකයාට ප්‍රථමයෙන් ලබා ගැනීමට කටයුතු කරනු ඇත.

(ආ) හදිසි අවශ්‍යතාවන් මත පැවැත්වූ රැස්වීම් උදෙසා ගමන් වියදම් ලෙස තැබී ඇති අතර අනාගතයේදී වැය ඇස්තමේන්තුව,අත්තිකාරම් ලබා ගැනීම සඳහා අනුමත බවට කාර්ය මණ්ඩලය මේ පිළිබඳ දැනුවත් කර ඇත.

(ඇ) උපායශීලී සැලැස්මකට හා ක්‍රියාකාරී සැලැස්මකට අනුව මෙවැනි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කටයුතු කෙරෙමින් පවතින නමුත් ප්‍රගතිය දැක්වෙන වාර්තා පිළියෙළ කිරීම තරමක් දුරට අතපසු වී ඇත.නමුත් මේ වන විට පසුගිය කාල සීමාව සඳහා එම වාර්තා පිළියෙළ කිරීම හා යාවත්කාලීන කිරීම බොහෝදුරට අවසන් වී ඇත.

4.3 <u>නිෂ්ක්‍රිය හා අඩු උපයෝජිත වත්කම්</u>

මෙය පරීක්ෂණ කටයුතු සඳහා වූ ශීතාගාරයේ කොටසයි. මෙය පාලනාකරණ මණ්ඩලයේ අනුමැතියෙන් ඉදිරියේ වියදම් කිරීමට පියවර ගනු ලැබේ.

4.4 <u>ප්‍රසම්පාදන කොන්ත්‍රාත් ක්‍රියාවලිය</u>

ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු මහලේ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා වූ ටෙන්ඩරය ඇගයීමේදී ප්‍රථම ස්ථානය දෙනු ලැබූයේ එහි අවසන් නිමාව හා යොදා ගන්නා ලද උපාංග ආදියෙහි ගුණාත්මකභාවය නොසලකා. ප්‍රමාණ පත්‍රයේ (BOQ ) සවිස්තරාත්මක උපාංග සඳහා රොසෙල් (Rocell ) හෝ එයට සමාන වර්ගයක් හා කරාම හා අනෙකුත් උපාංග සඳහා ග්‍රෝහේ (Grohe ) වර්ගයේ උපාංග බලාපොරොත්තු වන බව විශේෂයෙන් සඳහන් කර තිබුණි.එසේද මෙවැනි ආයතනයක වැසිකිළි පද්ධතියේ දිගුකාලීන පැවැත්ම කෙරෙහි උපාංග වල ගුණාත්මකභාවය හා නිමාව දැඩිව බලපාන බැවිනි.නමුත් පළමු ටෙන්ඩරයේ සඳහන් කර තිබුනේ ඉතාමත් අඩු මිල ගණන් වල සනීපාරක්ෂක උපාංග හා කරාම හා අනෙකුත් උපාංග බැවින් අදාළ ටෙන්ඩර් කරුවන්ගෙන් උසස් ගුණාත්මකභාවයක් හා නිමාවක් බලාපොරොත්තු විය නොහැකි විය.

එසේ වෙතත් දෙවැනි ටෙන්ඩරය පළමු ටෙන්ඩරයට වඩා ඉහළ අගයක් ගත් අතර එහි විෂය පරාය ප්‍රථම ටෙන්ඩරයට සාපේක්ෂව වෙනස් විය.තවද පළමු ටෙන්ඩරය කුඩා ටෙන්ඩරයක් (Minor Tender Board ) වන අතර දෙවැන්න විශාල ටෙන්ඩරයක් (Major Tender Board ) විය.තවද ඇගයීම සිදු කරනු ලැබුයේද වෙනස් ඇගයීම් කමිටු 2 කින් විය.

4.5 <u>හඳුනා ගන්නා ලද පාඩු</u>

විගණන විමසුම් හා එකඟ වෙමි. සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මාසිකව ගණනය කිරීමට හා එම නීති රීති අනුව දැඩිව ක්‍රියාකිරීමට කටයුතුකර ඇත.

5. <u>පද්ධති හා පාලන</u>

විගණන විමසුම් හා එකඟ වෙමි. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් මින් ඉදිරියේදී පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකරන අතර ක්‍රියාවලිය අනුගමනය කිරීමට කටයුතු කරනු ලැබේ.

(අ ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) මූල්‍ය පාලනය

H D Cller

අධ්‍යක්ෂ
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

Professor H. Janaka de Silva
MD, DPhil(Oxon.) FRCP
Director
Postgraduate Institute of Medicine
University of Colombo.